# මගේ ලොව හිරු මඬල
# ඔබයි බුදු සමිඳුනේ!...



මහමෙව්නාව භාවනා අසපුව

***මහමෙව්නාව භාවනා අසපුවෙන්
සැදැහැති ඔබ වෙත පිරිනැමෙන
දහම් තුටු පඬුරකි....***

මහමෙව්නාව භාවනා අසපුව
වඩුවාව, පොල්ගහවෙල.
දුර / ෆැක්ස් : 037 2244602
ඊ මේල් : mahamevnawa@mahamevna.org
වෙබ් අඩවිය : www.mahamevna.org

# පූජාච පූජනීයානං ....



"පින්වත් මහණෙනි, මේ බොහෝ දෙනා ගේ යහපත පිණිස, බොහෝ දෙනා ගේ සැපය පිණිස, බොහෝ දෙනා ගේ ත්, දෙවි මිනිසුන් ගේත් අර්ථය පිණිස, යහපත පිණිස, සැප පිණිස, මේ ලෝකයේ උපදින එක ම පුද්ගලයෙක් ඉන්නවා. ඒ තමයි නිවැරදි ආකල්ප ඇති සම්මා දිට්ඨියෙන් යුතු කෙනා. ඔහු බොහෝ දෙනා ව අධර්මයෙන් වෙන් කරලා, ධර්මයේ පිහිටුවනවා.

පින්වත් මහණෙනි, මේ තමයි බොහෝ දෙනා ගේ යහපත පිණිස, බොහෝ දෙනා ගේ සැපය පිණිස, බොහෝ දෙනා ගේ ත්, දෙවි මිනිසුන් ගේත් අර්ථය පිණිස, යහපත පිණිස, සැප පිණිස, මේ ලෝකයේ උපදින එක ම පුද්ගලයෙක් ඉන්නවා. ඒ තමයි නිවැරදි ආකල්ප ඇති සම්මා දිට්ඨියෙන් යුතු කෙනා."

දසබලසේලප්පභවා නිබ්බානමහාසමුද්දපරියන්තා
අට්ඨංග මග්ගසලිලා ජිනවචනනදී චිරං වහතූති

*දසබලයන් වහන්සේ නමැති ශෛලමය පර්වතයෙන් පැන නැගී*
*අමා මහා නිවන නම් වූ මහා සාගරය අවසන් කොට ඇති*
*ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වූ සිහිල් දිය දහරින් හෙබි*
*උතුම් ශ්‍රී මුඛ බුද්ධ වචන ගංගාව (ලෝ සතුන්ගේ සසර දුක නිවාලමින්)*
*බොහෝ කල් ගලාබස්නා සේක්වා !*

*(සළායතන සංයුත්තය - උද්දාන ගාථා)*



# බුදු සරණ යමු අපිත් පිළිසරණ සදා දුන්.....

ජීවිතය යනු සුවහසක් ගැටළු වලින් පිරුණු දෙයක්. එහෙත් අපි කවුරුත් කැමති අස්වැසිල්ලෙන් පිරුණු සැනසිලිදායක ජීවිතයකට යි. සිහිනයක් බොඳ වී යන්නා සේ ජීවිතය අවසන් වී යනු දකින්නට කවුරු නම් කැමති වෙත් ද? එහෙයින් සීරුවෙන් පා තබා පරෙස්සම් ගමනින් යාම වඩාත් හොඳ නොවේ ද? ඒ වෙනුවෙන් හැම කෙනෙක් ම යම් කිසි පිහිටක් පිළිසරණක් සොයා යනවා.

අනික් අතට මේ ජීවිතය හිතාගන්නට බැරි තරම් අවදානම්. කොයි මොහොතේ කුමන ආපදාවකින් අපට කරදර සිදු වේ දැයි කාහට නම් කිව හැකි ද? හරි ම අවිනිශ්චිතයි. කොයි පැත්තෙන්

බැලුවත් එක්තරා අසරණභාවයක් දකින්නට ලැබෙනවා. වචනවලින් කියා ගත නොහැකි මොකක්දෝ අඩුපාඩු සහිත බවක් ජීවිතවල තියෙනවා. ඔය අතරේ තම තමාගෙන් සිදු වූ අත්වැරදි වලට වන්දි ගෙවමින් සෝ සුසුම් හෙළන ජීවිත කොතෙක් ද? දුක් වේදනා හිත්වල පුරවාගෙන හිතින් හඬ හඬා සිටින ජීවිත කොතෙක් ද? ඊළඟට මේ තත්වය දිගින් දිගට ම පවත්වන්නට මෙන් සමහර ජීවිතවල අපල උපද්‍රව ග්‍රහදොස් යැයි කියා ගන්නා දේවලුත් සතුරු කරදරත් ඉවරයක් නැහැ. ඇත්තෙන් ම ජීවිතය අනාරක්ෂිතයි නේද? ඔය තත්වය නිසා ම අනාගතය පිළිබඳ සැක සහිත බවක් නේද සිතට ඇති වෙන්නේ? ඉතින් බොහෝ දෙනෙක් ජීවිතය සුරක්ෂිත කර දෙනවා යයි පෙනෙන බොහෝ දේ පසුපස ඔහේ දුව ගෙන යනවා. නැකත්, සුභ නිමිති, දේව වාක්‍යය, දෙවි රැකවරණ, අපල ලබාදෙන නව ග්‍රහයන්ට අයත් දෙවිවරු, හාස්කම් වලින් පිහිට ලබා ගැනීම, විශ්මය ජනක සෙත් ශාන්ති ආදී දහසක් දේ පසුපස යනවා. යම්කිසි අද්භූත දෙයකින් පිහිටක් ලබා ගන්නට පෙළඹෙනවා. එහෙත් අපේ අසරණකම කොතරම් ද කීවොත් ඒ කිසි දෙයක සත්‍යාසත්‍යභාවය සොයන්නට අප කැමති වෙන්නේ නැහැ.

එහෙත් බුදු රජාණන් වහන්සේ "ධජග්ග" නම් වූ දේශනාවේ දී දෙවියන් ගැන අපූරු රහසක් හෙළි කළා. එනම් කෙලෙස් සහිත මානසික තත්වයකින් සිටින ඒ දෙවියන් පවා හදිසි ආපදාවල දී අසරණ ව, තැතිගෙන කම්පනයට පත් ව පළා යන බවයි. ඉතින් අප ඉතාමත් භය පක්ෂපාත ව පිහිට ඉල්ලා සිටින දෙවියනුත් අප සේ ම අසරණ වෙත් නම්, තැති ගනිත් නම්, පළායත් නම්, එබඳු පිරිසකගෙන් අප බලාපොරොත්තු වන රැකවරණය ලබා ගත හැකි යයි සිතීම මුලාවක් නොවේ ද? මින් කියැවෙන්නේ දෙවියන් නැතැ යි නොවේ. ඔවුන් ද අප මෙන් ම අනාරක්ෂිත බවයි. එහෙත් අප යහපත් ක්‍රියාවක් කළ විට දෙවියන්ට ද එම පින් අනුමෝදනා කිරීම සත්පුරුෂ උතුමන් විසින් සම්මත ඉතා හොඳ පැරැණි සිරිතකි.

එහෙත් මේ ජීවිතයේ අපට මහත් සේ පිහිට උපකාරය පිණිස පවතින උත්තම දේ තෝරා බේරා ගැනීමේ හැකියාව අපට තිබිය යුතුය. නුවණින් සලකා යමක් අවබෝධ කර ගැනීමේ හැකියාව

අපට තිබිය යුතුය. උත්තම මුනිවරුන්ගේ දහම් අසා දැන ගත යුතුය.

ජීවිතය පිළිබඳ දේශනා කළ නොයෙක් ශාස්තෘවරු ලෝකයේ කලින් කලට පහළ වෙනවා. ඒ අතර ජීවිතය පිළිබඳ ඉතාමත් පැහැදිලි, ඉතා ම තර්කානුකූල, ඉතා ම නිදහස් චින්තනයක් ඇති මනුෂ්‍යත්වය ඉහළින් ම සැලකූ අප ගේ ශාස්තෘ වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තුන් ලොවට ම ඉහලින් වැඩසිටි සේක. තමන් වහන්සේ කුමන ගති ස්වභාවයකින් යුක්තව සිටින්නේ ද යන වග මෙසේ පෙන්වා දෙන සේක.

**"පින්වත් මහණෙනි, අරහත් වූ, සම්මා සම්බුදු වූ, තථාගතයන් වහන්සේ සියලු ආශාවලින් මිදී සිටිති. සියලු ද්වේශයෙන් මිදී සිටිති. සියලු මායා මෝහයෙන් මිදී සිටිති. එහෙයින් කිසිදු භයක් නැත. කිසිදු තැති ගැනීමක් නැත. කිසිදු මානසික කම්පනයක් නැත. කිසිසේත් පළා යන්නේ නැත. අභීතයහ. අකම්පිතයහ."**

**(ධජග්ග සූත්‍රය - සංයුක්ත නිකාය)**

පින්වතුනි, මොන තරම් ආශ්චර්යයක් ද බලන්න මේ ලෝකයේ වෙන කවර නම් ශාස්තෘවරයෙක් ද, තමන් මුළුමණින් ම කෙලෙසුන්ගෙන් නිදහස් වුණා කියා අභීත ව ප්‍රකාශ කළේ? එබඳු උත්තරීතර තත්වයකට පත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ හැර වෙන කෙනෙක් මනුලොව තබා දෙව්ලොව, බඹලොව හෝ කෙසේ නම් ලබන්නට ද? වරෙක උන්වහන්සේ තම කාරුණිකත්වය ගැන මෙසේ වදාළ සේක.

**"පින්වත් මහණෙනි, මේ ලෝකයේ මිනිසුන්ටත්, දෙවියන්ටත්, වඩාත් ම අනුකම්පා කරන්නේ, වඩාත් ම උදව් උපකාර කරන්නේ, වඩාත් ම ආදරය කරන්නේ, එකම එක්කෙනෙකි. ඒ වෙන කිසිවකු නොව සියලු කෙලෙසුන්ගෙන් මිදුණු සම්මා සම්බුදු රජාණන් වහන්සේ ය."**

**(අංගුත්තර නිකාය - 01)**

මේ ලෝකයට මෙබඳු වූ සම්බුදු උතුමෙකු ගේ පහළ වීම නිතර සිදුවන දෙයක් නොවේ. එයයි මුළු මහත් ලෝකයේ සිදු වූ

ඉතා ම දුර්ලභ සිද්ධිය. අතිශයින් ම කලාතුරකින් සිදුවන සිද්ධිය. ඒ බව උන්වහන්සේ විසින් ම මෙසේ පෙන්වා දී තිබෙනවා.

**"පින්වත් මහණෙනි, සම්මා සම්බුද්ධ යනු මේ ලෝකයේ පහළ වූ ඉතාමත් ආශ්චර්ය වූ මනුෂ්‍යයා ය. පින්වත් මහණෙනි, සම්මා සම්බුද්ධත්වයට පත් වූ උතුමෙකු පහළ වූවා යනු අඥානකම නැමැති අන්ධකාරය දුරු කරන ප්‍රඥාලෝකයේ පහළවීම යි. මායා වංචා පිරී ගිය අසත්‍යයේ කඩතුරාව ඉරා දමන සත්‍යයේ උදාව යි. දුක් දොම්නස් දුරු කරන සෙත ශාන්තියේ උදාව යි. සියළු මානසික වහල් බැම්වලින් මිදුණු සනාතන විමුක්තියේ උදාව යි. සැනසිලි මග හඳුනාගත් සෝවාන් වූ තථාගත ශ්‍රාවකයන් ගේ පහළ වීම යි. ධර්මය හඳුනාගෙන විමුක්තිය උදෙසා කැපවී කෙලෙස් සංසිඳවා ගත් සකෘදාගාමී තථාගත ශ්‍රාවකයන්ගේ පහළ වීම යි. රාගයත් ද්වේෂයත් සදහට ම සිතෙන් ඉවත් කරගත් අනාගාමී වූ (නැවත කාම ලෝකයට නො පැමිණෙන) තථාගත ශ්‍රාවකයින්ගේ පහළ වීම යි. සියලු කෙලෙසුන්ගෙන් මිදී සදාකාලික සැපය වූ නිර්වාණය අවබෝධ කිරීමෙන් රහත් වූ තථාගත ශ්‍රාවකයින්ගේ පහළ වීම යි. මෙසේ පින්වත් මහණෙනි, සම්මා සම්බුදු කෙනෙකුගේ පහළ වීම දෙව් මිනිසුන්ගේ භාග්‍යය උදාවීමකි."**

(අංගුත්තර නිකාය 01)

මොහොතක් හිතා බලන්න. මොනතරම් දුර්ලභ මොහොතක් ද අපට උදා වී තිබෙන්නේ. බුදුරජාණන් වහන්සේ ගේ ඒ සුවිශේෂ ආධ්‍යාත්ම බලය විශ්මයජනක යි. මුළු මහත් විශ්වය පුරා ම කිසිදු බාධාවකින් තොරව තම ධර්මය පැතිරවීමේ හැකියාව උන්වහන්සේ තුළ පැවතුණා. ආනන්ද හිමියන් සමග ඒ ගැන වදාළේ මෙහෙමයි.

**"පින්වත් ආනන්ද, අපට පායන හිරු සඳුගෙන් දහසක් ග්‍රහලෝක එළිය වෙනවා. එවැනි චක්‍රාවාට දහසක් තිබෙනවා. ඒ සා පැතිරී ගිය මුළු මහත් විශ්වය පුරා ම තථාගතයන් වහන්සේට ආලෝක තරංග යැවිය හැකිය. පිටසක්වල ජීවීන්හට ඒ ආලෝක ධාරා හොඳින් හඳුනාගන්නට පුළුවන්. ඒ ආලෝක තරංග ඔස්සේ තථාගතයන්ට ශබ්ද තරංග සම්ප්‍රේෂණය කළ හැකියි. ඒ ශබ්දයන් ද ඔවුන් හඳුනාගන්නවා."**

(අංගුත්තර නිකාය 03)

විශ්මයජනක වූ අපූර්ව වූ ආධ්‍යාත්මික ශක්තියකි, උන්වහන්සේ තුළ වූයේ. එමෙන් ම එපමණ පිවිතුරු, එපමණ නො කැළැල්, එපමණ ශාන්ත, එපමණ ගාම්භීර, එපමණ උදාර චරිතයක් වෙන කවරෙකු තුළ දකින්න ද? මේ ලෝකයට ඉතා ම අවශ්‍ය වූ ආදරය, කරුණාව, දයානුකම්පාව, ඉවසීම, නිහතමානී බව, වංචාවෙන් තොර වීම, බුද්ධිමත් බව, තැනට සුදුසු නුවණ, තීක්ෂණ ප්‍රඥාව ආදී උත්තම ගුණයන්ගෙන් ඒ ජීවිතය පිරී ගොස් තිබුණා.

සිවුරකින් ගත වසාගත්, ලද අහරින් යැපුණු, චාම් ලෙස දිවි ගෙවූ, මේ උත්තම මනුෂ්‍ය රත්නයේ අභිමානවත් ජීවිතයට අන්‍යාගමික මිත්‍යාදෘෂ්ටිකයන් පමණක් නොව, උන්වහන්සේගේ ම ඇතැම් අඥාන ශ්‍රාවකයන් පවා ඊර්ෂ්‍යා කළා. දේවදත්ත නැමැති ශ්‍රාවකයෙක් උන්වහන්සේගේ ජීවිතය විනාශ කරන්නට නොයෙක්වර මහන්සි ගත්තා. වරෙක නාලාගිරි නම් චණ්ඩ හස්ති රාජයාට රා පොවා මත්කොට උන්වහන්සේ ළඟට එව්වා. වරෙක චර පුරුෂ ඝාතක කණ්ඩායම් එව්වා. ඒත් ඒ සියල්ල අසාර්ථක වුණා. අවසානයේ දී දෙව්දත් තීරණය කළේ සියතින් මහා කාරුණිකයන් වහන්සේ ගේ උදාර ජීවිතය ඝාතනය කරන්නට යි.

එදා භාග්‍යවතුන් වහන්සේ විවේක සිතින් ගිජුකුළු පව්ව පාමුල සක්මන් කරමින් සිටියා. හොරෙන් ම එම පර්වතය මුදුනට නැග ගත් දෙව්දත් මහත් වූ කළු ගලක් උන්වහන්සේගේ හිසමතට හෙලුවා. ඒත් එතන දී පුදුමාකාර භාස්කමකි සිදු වූයේ. උන්වහන්සේව ඒ අනතුරෙන් රැකගන්නට කිසිම මනුෂ්‍යයෙක් අසල සිටියේ නැහැ. කිසි දෙවියෙක් අසලක සිටියේ නැහැ. එහෙත් හිත් පිත් නැති මේ මහ පොළොව වහාම ක්‍රියාත්මක වුණා. සැණෙකින් විශාල ගලක් පොළොවෙන් මතු වී අර ගල වළකා දැම්මා. බාහිර උපක්‍රමයකින් උන්වහන්සේව ඝාතනය කළ නො හැකි බව නැවත වරක් ලොවට ම ප්‍රත්‍යක්ෂ වුණා.

එහෙත් මේ සිද්ධිය, උන්වහන්සේට මුළු හදවතින් ම ආදරය කළ ශ්‍රාවකයින්ට මහත් වේදනා ගෙන දෙන්නක් වුණා. ඔවුන් කම්පනයෙන් සිටිනු දුටු අකම්පිත සිත් ඇති බුදුරජාණන් වහන්සේ තම ජීවිතයේ ආශ්චර්යවත් ලක්ෂණයක් මෙසේ හෙළි කළ සේක.

**"පින්වත් මහණෙනි, කම්පා වන්නේ මන්ද? කලබල වන්නේ මන්ද? තැති ගන්නේ මන්ද? නැත. ඔබ කම්පා නො විය යුතුය. බිය නො විය යුතුය. තැති නො ගත යුතුය. බාහිර ආරක්ෂාවක කිසිදු අවශ්‍යතාවයක් නොමැත.**

**පින්වත් මහණෙනි, එසේ ම දැනගන්න. තථාගතයන් වහන්සේගේ ජීවිතය නිමවන්නේ බාහිර උපක්‍රමයකින් නොව, තම කැමැත්තෙන් ගත් තීරණය පරිදි ය. ඉතා ම සිහි නුවණින් ය. ශාන්ත ලෙස ය."**

තුන්ලොව ඇති අසමසම, අසහාය පාරිශුද්ධ නායකත්වය උන්වහන්සේ ය. උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පමණක් නොවේ. ජ්‍යෙෂ්ඨත්වය ද අසහාය ය. වේරංජ නම් වංශවත් මිනිසෙකුට මේ බව උන්වහන්සේ ම පැහැදිලි කළහ.

**"පින්වත් බ්‍රාහ්මණය, උපමාවකින් කියතොත් මේ ජීවිත බිත්තර සමූහයක් වැන්න. අඥානකම නැමැති ගණ කටුවෙනුයි, ඒ බිත්තර සැකැසී තිබෙන්නේ. මුළුමුනින් ම ඒ කටුවට හිර වෙලයි පවතින්නේ.**

**පින්වත් බ්‍රාහ්මණය, අඥානකම නැමැති හාත්පස වෙළා ගත් ඒ ඝන කටුව මගේ උත්සාහයෙන් ම ප්‍රඥාව නම් වූ නිය සිලෙන් සිදුරු කොට එළියට පැනගත් පළමු තැනැත්තා මම වෙමි. එහෙයින් බ්‍රාහ්මණය මගේ ම බුද්ධියෙන් ද ස්වෝත්සාහයෙන් ද ගුරූපදේශ රහිතව ධර්මාවබෝධ කළ හෙයින් මම වනාහී ලොවට ජ්‍යෙෂ්ඨ ද වෙමි. ශ්‍රේෂ්ඨ ද වෙමි."**

**(වේරංජා සුත්ත - අ.නි. 06)**

ඉතින් පින්වතුනි, බුදුරජාණන් වහන්සේ ගේ අසලටවත් පැමිණි වෙන කෙනෙක් මේ ලෝක ධාතුවේ කෙසේ නම් සොයන්ට ද? මෙබඳු උත්තමයෙකු අප ගේ අධ්‍යාත්මික නායකයාණන් ලෙස තෝරා ගෙන සිටීමට තරම් අප වාසනාවන්ත වීම ගැන අපමණ සතුටු වෙමු. සැබැවින් ම අපි අන්‍යාගමික, අන්‍යතීර්ථකයන්ගේ ශ්‍රාවකයන් නො වෙමු. අපි කවුරුත් ඉතා ම ආදරයෙන් බුදුරජාණන් වහන්සේ සරණ ගිය උන්වහන්සේගේ ම ශ්‍රාවකයන් වෙමු. උන්වහන්සේ අවබෝධයෙන් යුතුව වදාළ ධර්මයත්, උන්වහන්සේගේ ශ්‍රාවක වූ මාර්ග-ඵල ලාභී ආර්යයන් වහන්සේලාත්

යන මේ තෙරුවන සරණ ගියෙමු. එක් වතාවක් පමණක් නොවේ. දුතියම්පි, තතියම්පි කියමින් තුන් වතාවක් ම සරණ ගියෙමු. මෙසේ යම් කෙනෙක් මුළු හදවතින් ම, හිතට එකඟව අවංක ව තෙරුවන් සරණ යාම ගැන උන්වහන්සේ ම පැහැදිලි කළ සේක.

**"පින්වත් ආනන්ද, ඔය සඳුන් සමන් ආදී මල්වලින් හමන සුවඳ හමා යන්නේ යටි සුළඟට පමණ යි. එහෙත් ඔබ මෙය දන්නවා ද? මුළු හදවතින් ම තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයා ගේ ගුණ සුවඳ දෙව්ලොවට ම පවා හමා යනවා. දෙව්ලොව දෙවියන් ඒ ගැන මේ විදිහට කතා වෙනවා.**

**පින්වත්නි, බලනු මැනවි, මිනිස් ලොව බුද්ධිමත් මිනිසුන්ගේ අසිරිය. අසවල් ගමේ අසවල් නම් ඇති අසවල් ස්ත්‍රීන්, අසවල් පුරුෂයන් මුළු හදවතින් ම බුදුන් සරණ ගිහින්, දහම් සරණ ගිහින්, සඟුන් සරණ ගිහින්, සැබැවින් ම ඒ මනුෂ්‍යයන් වාසනාවන්තයි."**

**(අංගුත්තර නිකාය 03)**

ජීවිතයේ අනුගමනය කිරීම සඳහා තමන් තෝරා ගන්නා ධර්මය තමාට ඉතා ම තදින් බලපාන බව උන්වහන්සේ හොඳින් දැන සිටි සේක. ඒ නිසා උන්වහන්සේ නිතරම වදාළේ කෙනෙකු අනුගමනය කළ යුත්තේ වඩාත් විසිතුරු දේ නොව වඩාත් පිවිතුරු දේ බව යි. තෙරුවන් සරණ යාම යනු පරම පිවිතුරු දෙයකි.

**"ආනන්දය, යම් කෙනෙක් තම දෙමව්පියන්ට ආදරේ නම් දූ දරුවන්ට ස්නේහවන්ත නම්, හිතමිතුරන්ට සානුකම්පිත නම් ඔහු කළ යුතු පාරිශුද්ධ දෙයක් තිබේ. එනම් ඔවුනට ඉතා ම පැහැදිලි ලෙසත්, ස්ථිර ලෙසත් තෙරුවන් සරණ යන හැටි කියා දීම යි. මුළු හදවතින් ම සමාදන් කරවීම යි.**

**පින්වත් මහණෙනි, යමෙක් පාරිශුද්ධ සන්තානයක් ඇති තථාගතයන් වහන්සේගේ සම්බුද්ධත්වය මුළු හදවතින් ම පිළිගනී ද, අදහා ගනී ද, නිසැක බවට පත්වෙයි ද, එය ඔහුට සැනසීම ලබා දෙන පළමු වන මහා පුණ්‍ය ගංගාව යි. කුසල ගංගාව යි."**

**(අභිසන්ද සුත්ත - ස.නි. 05)**

**"පින්වත් මහණෙනි, යමෙක් වනාහී තථාගතයන් වහන්සේගේ**

**සම්බුද්ධත්වය නො පිළිගනී ද, නො අදහා ගනී ද සැක කරයි ද, ඔහු දිළින්දෙකි. ආධ්‍යාත්ම දිළින්දෙකි.”**

**(ඉණ සුත්ත - අං.නි. 5)**

**“එහෙත් පින්වත් මහණෙනි, යමෙක් මුළු හදවතින් ම තෙරුවන් සරණ ගියේ නම්, තථාගතයන් වහන්සේගේ සම්බුද්ධත්වය මුළු හදවතින් ම අදහා ගනී නම්, ඒ අවංක ශ්‍රද්ධාවන්තකම ඔහු සතු මහා ධන සම්පත යැ යි කියමි.”**

**(විත්ථත ධන සුත්ත - සං.නි. 5)**

වරෙක උන්වහන්සේගේ ළඟ ම ඥාතිවරයෙක් වූ ශාක්‍යවංශික මහානාම තෙමේ අවංක ශ්‍රාවකයෙකුගේ ශ්‍රද්ධාව ගැන කියා දෙන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටියා. එහිදී උන්වහන්සේ විස්තර කළේ මේ ආකාරයටයි.

**“පින්වත් මහානාම, සැබෑ ලෙස තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයා තුළ පැවතිය යුත්තේ මෙන්න මේ ආකාරයේ ශ්‍රද්ධාවකි.**

**ඔහු තථාගතයන් වහන්සේගේ සම්බුද්ධත්වය මුළු හදවතින් ම අදහා ගනී. එනම් ඔහු නොයෙක් අයුරින් සම්බුදු ගුණ හඳුනා ගනී. ඒ මෙසේ ය.**

**ඒ භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ මේ මායා මෝහ ජාලය සිඳ දමා සියලු රාග, ද්වේෂ, මෝහ ආදී කෙලෙස් වලින් මුළුමනින් ම මිදුණු බව (අරහං) මුළු හදවතින් ම පිළිගනී.**

**උන්වහන්සේ ගුරූපදේශ රහිත ව ස්වකීය බුද්ධියෙන් හා වීර්යයෙන් යුතුව සියල්ල අවබෝධ කළ බව (සම්මා සම්බුද්ධ) මුළු හදවතින් ම පිළිගනී.**

**උන්වහන්සේ ඉතා ම පිවිතුරු සීලයෙකින් යුතුව සමාධිමත් සිතකින් යුතුව, අඥානකම දුරු කොට විද්‍යාව පහළ කරගත් බව (විජ්ජාචරණ සම්පන්න) මුළු හදවතින් ම පිළිගනී.**

**උන්වහන්සේ පැහැදිලිව ම විමුක්තිය උදෙසා වෙහෙස මහන්සි වී ඒ විමුක්තිය සාක්ෂාත් කළ බව (සුගත) හදවතින් ම පිළිගනී.**

**උන්වහන්සේ මෙලොව පමණක් නොව, අපායේ ද, දිව්‍ය ලෝකයේ ද, බ්‍රහ්ම ලෝකයේ ද, මුළු මහත් විශ්වයේ ම රහස් සොයා ගත් බව (ලෝකවිදූ) මුළු හදවතින් ම පිළිගනී.**

**විමුක්තිය සළසා ගැනීමට පින් තිබෙන ඕනෑම මිනිසෙකුට හෝ දෙවියෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ඒ මග පෙන්වා දී ඔහුට විමුක්තිය සළසා දිය හැකි බව (අනුත්තර පුරිසදම්ම සාරථී) මුළු හදවතින් ම පිළිගනී.**

**උන්වහන්සේ දෙවියන්ගේත්, මිනිසුන්ගේත් එක ම හා උත්තම ආදරණීය ගුරුවරයා බව (සත්ථා දේවමනුස්සානං) මුළු හදවතින් ම පිළිගනී.**

**උන්වහන්සේ මහත් වූ කැපවීමකින් යුතුව අවබෝධ කළ ධර්මය, සඟවා නො ගෙන සතුටින් බෙදා දුන් බව (බුද්ධ) මුළු හදවතින් ම පිළිගනී.**

**එක ම එක මිනිසෙකු තුළ තිබෙන මේ සා ආශ්චර්යවත් ගුණ සමූහයක් ඇති කර ගැනීමේ භාග්‍යවන්තයා උන්වහන්සේ පමණක් බව (භගවා) මුළු හදවතින් ම පිළිගනී.**

**පින්වත් මහානාමය, යමෙක් මෙන්න මේ ආකාරයට සම්බුදු ගුණ හඳුනා ගනී ද එය ඔහුගේ සැබෑ ම ශ්‍රද්ධාවකි."**

පින්වතුනි, අපිත් මුළු හදවතින් ම තෙරුවන් සරණ යමු. වෙන කිසි කෙනෙක් හෝ වෙන කිසිදෙයක් සරණ නො යමු. මේ ලෝකයේ වඩාත් අවංක, වඩාත් ම සීලවන්ත, වඩාත් ම ඥාණවන්ත, වඩාත් ම කරුණාවන්ත, වඩාත් ම බුද්ධිමත්, උත්තම වූ ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සරණ යාම තරම් වෙන උත්තම දෙයක් කොයින් ලබන්නට ද? අවබෝධයෙන් යුතුව තෙරුවන් සරණ යාමෙන් සාර්ථක වන්නේ මෙලොව ජීවිතය පමණක් නොවේ. පරලොව ජීවිතය ද ඒකාන්තයෙන් ම සැනසිලිදායක වනු ඇත. ඔහු කිසිසේත් නරක තැනක නූපදී. ඒ බව සම්බුදු මුවින් ම වදාළ තැන් තිබේ.

**"පින්වත් මහානාමය, යම්කිසි කෙනෙක් දිගු කලක් මුළුල්ලේ**

**මුළු හදවතින් බුදුන් සරණ ගියේ නම්, මුළු හදවතින් ම දහම් සරණ ගියේ නම්, මුළු හදවතින් ම ඒ ශ්‍රාවකත්වය සරණ ගියේ නම් ඒ සැදැහැවත් තථාගත ශ්‍රාවකයා කෙසේ නම් නරක තැනක උපදින්ට ද?"**

**(සරකානි සුත්ත - සං.නි. 5)**

එසේ නම් දැන් අපට ඉතා ම පැහැදිලි ය, අපගේ ජීවිතයේ සියළු දුක් පහකොට, සියළු ධෛර්යයත්, සැනසීමත්, භාග්‍යයත්, සළසා දිය හැකි උත්තමයෙක් සිටී. උන්වහන්සේගේ සම්බුදු බලය ඉතා ම ආශ්චර්ය ය, අචින්තනීය ය. මුලු මහත් විශ්වය පුරා ම බලපවත්වයි.

ඉතින් ඔබටත් ඒ උදාර ශක්තියේ පිළිසරණ ඒකාන්තයෙන් ම ලබා ගත හැකි ය. අපල උපද්‍රවයන්ගෙන් අතුරු අන්තරාවන් ගෙන්, ග්‍රහදොස් නැකැත් දොස්, ආදියෙන් මිදීම පිණිසත් ඒ සම්බුදු පිහිට ම ලබාගත හැකිය.

සියළු ප්‍රාර්ථනා සඵල කර ගැනීම පිණිසත්, අපට පීඩා කරන යම්කිසි අතීත කර්ම දෝෂ ඇත්නම් ඒවා ද ඉක්මණින් ම ගෙවා දමා සැප විපාක දෙන කුසල කර්ම උපදවා ගැනීම පිණිසත්, ඒ සම්බුදු පිහිට ම ලබා ගත හැකිය.

සම්‍යක් දෘෂ්ටික බෞද්ධ දේව මණ්ඩලයේ ආශිර්වාදයත්, අනුග්‍රහයත් ලබා ගනු පිණිස, ඒ සම්බුදු පිහිට ම ලබා ගත හැකිය. එපමණක් නොවේ, සදහට ම සංසාරික දුක් නිමා කොට මාර්ග ඵල පිළිවෙලින් ලබා අමා මහ නිවන් සුව අවබෝධ කර ගැනීම පිණිසත්, ඒ සම්බුදු පිහිට ම ලබා ගත හැකිය.

*සාදු! සාදු!! සාදු !!!*

# දස බල ධාරී ගෞතම මුනි රජු

බොහෝ දෙනෙක් සිතා ගෙන සිටින්නේ අලුත් ම අලුත් විද්‍යාත්මක යුගයකට අප පිවිසෙමින් සිටින බවයි. නමුත් අපේ බුදුරජාණන් වහන්සේ බිහි කළ සැබෑ ම විද්‍යාත්මක යුගය අබිභවා යන්නට තවම කිසිවෙකුට හෝ පුළුවන් වුයේ නැත. තවම මේ ගතවෙන්නේ එක ම යුගයකි. එනම් ගෞතම බුදුරජාණන් වහන්සේගේ යුගය යි. එම යුගය තවම නටඹුන් වී නැත. එම යුගය තවමත් ජීවමාන යි.

මේ කරුණ ගැන හොඳින් සිතා බලන්න. මේ වන විට ඉන්දියාවේ කෝටි සංඛ්‍යාත ජනකායක් රාමායනය අදහමින් සිටිති. රාමා - සීතා දෙවියන් අදහමින් සිටිති. නමුත් එබඳු දෙවියන් මේ මිහිපිට සිටි බවට කිසිදු ඓතිහාසික සාධකයක්, කිසිදු පුරා විද්‍යාත්මක තහවුරු කිරීමක්, තවමත් කරගන්නට ඔවුන් තවමත් සමත් වී නැත. එමෙන් ම කෝටි සංඛ්‍යාත ජනකායක් භගවත් ගීතාව තුළින් කෘෂ්ණ දෙවියන් අදහමින් සිටිති. එම දෙවියන් ද මේ මිහිපිට සිටි බවට කිසිදු පුරාවිද්‍යාත්මක සලකුණක් නැත. රාමායනයෙන් කියවෙන්නේ 'ත්‍රෙත යුගය' නමින් වූ යුගයක් ගැනයි. භගවත් ගීතාවේ සඳහන් වන්නේ 'ද්වාපර' නම් වූ යුගයක් ගැනයි. සමහර විට අතීතයේ මෙවැනි යුග තියෙන්නත් ඇති. නමුත් මේ වන විට ඒ ගැන අල්ප මාත්‍ර වූ හෝ සාධකයක් වත් ඉතිරි වී නැත. එම සියලු යුග අනිත්‍යයේ ප්‍රහාරයෙන් අතුරුදන් වී ගොස් ය. දැන් මේ අප ගතකරමින් සිටින්නේ කලි යුගය යි. මෙම කලි යුගය අර්ථවත් කරන ලද්දේ අන් කවරකු විසින් හෝ නොව ගෞතම බුදුරජාණන් වහන්සේ විසිනි.

මේ වන විට බටහිර උගත්තු ජේසුතුමාගේ ජීවන චරිතය පවා බරපතල වාද විවාදයන්ට භාජනය කරමින් සිටිති. මෑතකදී ලොව පුරා ප්‍රචලිත වූ ඩාවින්චි කෝඩ් නවකථාව හා චිත්‍රපටය තුළින් ජේසු චරිතය මහත් ආන්දෝලනයකට ලක් කරන ලදී. ජේසුතුමා බෞද්ධ භික්ෂුවක් බවත්, කලක් ඉන්දියාවේ සිටි බවත් සඳහන් කරමින් බොහෝ පොත් පත් ලියවෙමින් තිබේ. බයිබලයේ ඇති ඉගැන්වීම් පිළිබඳ විශ්වසනීයත්වය ගැන දැන් බටහිර උගතුන් අතර නොයෙක් සැක සංකා මතු කරවන ප්‍රකාශයන් පැතිර යමින් තිබේ.

මේ අතර අන්තවාදී මුස්ලිම් සංවිධාන විසින් ලොව පුරා කරගෙන යනු ලබන මනුෂ්‍ය ඝාතන හා නොයෙකුත් ප්‍රහාර මගින් අමුතුම අවිනිශ්චිත වටපිටාවක් නිර්මාණය කරමින් තිබේ. ලෝකයේ ඇති ප්‍රධාන සහ බලවත් ම ආගම් දෙක වන කතෝලික හා ඉස්ලාම් ආගමික බැතිමතුන් අතර අන්‍යෝන්‍ය සුහදත්වය බරපතල ලෙස නැවතත් පළුදු වෙමින් තිබෙන බව කිසිවෙකුට හෝ සැඟවිය නො හැකිය.

මෙවන් වටපිටාවක ගිනි ගත් ලොවට සිසිලස බෙදමින් ගෞතම බුදුරජාණන් වහන්සේගේ යුගය ඉතාමත් ශාන්තව, හෙම්හිට දිලිසෙන්නට පටන් ගෙන ඇත. ගෞතම බුදුරජාණන් වහන්සේගේ ජීවන චරිතය ඓතිහාසික එකකි. පුරාවිද්‍යාත්මක ගවේෂණ මගින් සියයට සියයක් ම තහවුරු කරන ලද එකකි. ලෝකයෙහි කිසිවෙකුට හෝ සම්බුද්ධ ජීවන චරිතය කිසිසේත් ප්‍රතික්ෂේප කරන්නට බැරි තැනකට දැන් පැමිණ තිබේ.

ලුම්බිනී යන ග්‍රාමය අයත් වන්නේ නේපාල රජයට යි. ඉංග්‍රීසි යුගයේ දී මෙම ග්‍රාමයේ තිබී සිටවන ලද ගල් කුළුණක් හමුවිය. එම ගල්කුළුණු අශෝක රජතුමා විසින් ය සිටවා තිබෙන්නේ. එම කුළුණේ අශෝක අක්ෂර වලින් විශේෂ දෙයක් ලියා තිබුණි. එනම් "මෙතැන ශාක්‍යමුනි බුදුරජුන් උපන් ස්ථානය යි එයට ගෞරවයක් වශයෙන් මෙම ගම්මානය අයබදු වලින් නිදහස් කරනවා." යනුවෙනි. ඒ අසල ම පැරණි විහාරයක් තිබුණි. ජපන් රජයේ මැදිහත් වීමෙන් නේපාල පුරා විද්‍යාව මගින් එම විහාරයේ කැණීම් කරන ලදී. ඉතාමත් පරෙස්සමෙන් කැණීම් කරන ලදී. අවසානයේ

දී මුළුමහත් බෞද්ධ ලෝකයා ම මවිතයට හා අප්‍රමාණ ප්‍රීතියට පත්කරවමින් 'සිද්ධාර්ථ ගෞතම ශාක්‍ය මුනිරජ උපන් තැන' ඉතාම නිවැරදිව මතුවූයේ ය. මෙය තිබෙන්නේ අශෝක කුළුණට බඹ දෙක තුනක් ඈතින් සංරක්ෂණය කරන ලද ගොඩනැගිල්ල තුළ ය. දැන් මෙය ලෝකයෙහි කිසිවෙකුට හෝ කිසිසේත් බිඳලිය නොහැකි ඓතිහාසික සත්‍යයකි.

වර්තමාන ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයට අයත්ව ගයා නම් වූ දිස්ත්‍රික්කයක් තිබේ. එම දිස්ත්‍රික්කයේ පැරණි උරුවෙල් දනව්ව පිහිටා ඇත. එහි අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයට පත් වූ භූමිය තවමත් සුරක්ෂිතව පවතියි. මෙම භූමි භාගය හඳුන්වන්නේ 'බුද්ධගයාව' යනුවෙනි. අනගාරික ධර්මපාල තුමාණන් ගේ අප්‍රතිහත ධෛර්යයේ ප්‍රතිඵලයක් වශයෙන් මුලු ලෝකය පුරා ම මෙම භූමිය මහත් ප්‍රසිද්ධියට පත් විය. අශෝක රජුගේ පටන් විවිධ රජදරුවන් විසින් බුදුරජුන් ලොව ජයගත් වජිරාසන භූමිය වටකොට තැනූ විහාරාංග තවමත් දකින්නට පුළුවනි. මේවායේ ඇති ඓතිහාසික සත්‍යතාවය කතා කිරීමේ දී කිසිවෙකුගේ හෝ දිව නො පටලැවෙන්නේ මෙය එතරම් ම සත්‍ය නිසා ය.

වර්තමාන ඉන්දියාවේ උත්තර් ප්‍රදේශ ප්‍රාන්තයට අයත් බරණැසට ආසන්නයේ සාරානාත් නම් වූ භූමි භාගයක් තිබේ. සාරානාත් යන්නෙහි තේරුම 'මුලුමනින් ම පිහිට රැකවරණය ඇති තැන' යන්න ය. එය එදා අපගේ බුදුරජුන් පළමු ධර්ම දේශනය පවත්වා වදාළ 'බරණැස ඉසිපතන මිගදාය' යි. මෙහි සෙල් ලිපි තුළින් දම්සක් පැවතුම් සූත්‍රය මතු විය. එම සූත්‍රය දෙසා වදාළ තැන ඉතාම නිවැරදිව පුරා විද්‍යාත්මක ගවේෂණ තුළින් සියයට සියයක් ම තහවුරු කොට තිබේ. මෙය ද ඓතිහාසික සත්‍යයකි.

උත්තර් ප්‍රදේශ ප්‍රාන්තයේ ම කුසීනගර් නමින් ගමක් තිබේ. එහි ගෞතම බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ භූමිය වන 'කුසිනාරාවේ පාවා නුවර මල්ල රජදරුවන්ගේ උපවර්තන සල් උයන' පිහිටියේ ය. මෙය ද පුරා විද්‍යාත්මක ගවේෂණ තුළින් ඉතාමත් ම නිවැරදි ලෙස තහවුරු කොට තිබේ. ඉතින් අපගේ බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ අනුස්මරණීය ස්ථාන හතර ම

ලොව ආගමික උන්මත්තකයින්ගේ පීඩාවන්ට මොනතරම් හසු වී ගිය ද, තවමත් ඒවා සුරක්ෂිත වී තිබීම බුදුරජුන්ගේ ම ආශ්චර්යයක් විනා අන් කුමක් ද?

එපමණක් ද නොවේ, ඕනෑම කෙනෙකුට කිසිදු සැකයකින් තොරව සර්වඥ ධාතූන් වහන්සේලා අදත් සියැසින් දැක්ක හැකිය. නවදිල්ලි නගරයෙහි පිහිටි ඉන්දීය ජාතික කෞතුකාගාරයෙහි ඉතාම ගෞරව සම්ප්‍රයුක්තව එම ධාතූන් වහන්සේලා ප්‍රදර්ශනය පිණිස තබා ඇති ආකාරය ඕනෑම කෙනෙකුට දැක්ක හැකිය.

මෙය මහා පුදුමයකි. ලෝකයේ වෙන කිසිම කෙනෙකුන් ගැන මෙතරම් ඓතිහාසික සාධක දකින්නට නැත. වෙන කිසිම කෙනෙකුගේ ඓතිහාසික තොරතුරු මෙතරම් ආරක්ෂා වී නැත. එපමණකුත් නොවේ, ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් බුදු මුවින් ම දේශනා කොට වදාරණ ලද ශ්‍රී සද්ධර්මය ඒ ආකාරයෙන් ම අදත් ඕනෑම කෙනෙකුට කියවිය හැකිය. පාළි භාෂාවෙන් තිබෙන එම බුද්ධ දේශනා ලෝකයේ විවිධ භාෂාවන්ට පරිවර්තනය වී ඇත. විශේෂයෙන් ම තායි, බුරුම, කාම්බෝජ හා හින්දි යන භාෂාවලින් ඇති බුද්ධ දේශනා ඒ ඒ රට වාසීන් ට කියවීමේ වාසනාව ලැබී ඇත. එමෙන් ම ඉංග්‍රීසි දන්නා ඕනෑම කෙනෙකුට සියලු ම බුද්ධ දේශනාවන් හි ඉංග්‍රීසි පරිවර්තන කියවීමේ අවස්ථාව ලැබී ඇත.

බුද්ධදාස රජු දවස සිංහලට පරිවර්තනය කරන ලද ත්‍රිපිටකයක් තිබී ඇති නමුත්, එය අභාවයට පත්ව ගොස් ඇත. සියවස් ගණනාවකට පසු බුද්ධ ජයන්ති ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලය මගින් කරන ලද පරිවර්තන සිංහලයෙන් කියවීමට ලැබුණත්, ඒවා තේරුම් ගැනීමට අසීරු බව කාටවත් සැඟවීමට නො හැකියි. එච්.පී. ද සොයිසා මහතාගේ ද සිංහල ත්‍රිපිටක පරිවර්තනයක් තිබුණ නමුත්, දැන් ඒවා සොයාගන්නට නැත. නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් ද ත්‍රිපිටකය සරල සිංහලෙන් පරිවර්තනය කොට තිබේ. ඕනෑම කෙනෙකුට ඒවා මිලට ගෙන කියවිය හැකිය. අප විසින් කරන සිංහල ත්‍රිපිටක පරිවර්තන සැදැහැවත් බෞද්ධ ජනතාව අතර මහත් ගෞරවාදරයට පාත්‍ර විය. ඒ තුළින් ඔවුන් හට බුදුරජාණන් වහන්සේ

වදාළ ධර්ම දේශනා රාශියක් කියවා තේරුම් ගැනීමේ වාසනාව උදාවිය. එය මෙම යුගයේ ජීවත් වන මනුෂ්‍යයන් හට උදාවූ දුර්ලභ වාසනාවක් බව ඊර්ෂ්‍යාවකින් තොරව දක්නා ඕනෑම කෙනෙකුට පැහැදිලිව පෙනෙන දෙයකි.

බුදුරජාණන් වහන්සේව හඳුනාගැනීමට නම් ධර්මය දැක්ක යුතුය. "යෝ ධම්මං පස්සති - සෝ මං පස්සති" යමෙක් ධර්මය දකී නම් ඔහු මා දකී යනුවෙන් වදාරණ ලද්දේ බුදු රජාණන් වහන්සේ විසින් ය. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් සෝභමාන වූ සම්බුදු සිරුර දෙස බලාසිටි වක්කලී හිමියන්ගෙන් බුදුරජුන් විමසා වදාළේ "කිං තේ වක්කලි ඉමිනා පූතිකායේන දිට්ඨේන?" පින්වත් වක්කලී, මේ කුණු ශරීරය දැකීම තුළින් ඔබට ලබා ගත හැක්කේ කුමක් ද? කියා ය. ඒ බුදුරජාණන් වහන්සේගේ දස බල බුද්ධ ඥාණ, විශාරද බුද්ධ ඥාණ ආදී සියලු ඥාණයන් දැක ගත හැක්කේ උන්වහන්සේ වදාළ දෙසුමන් තුලින් පමණි. එය තෙරුවන් සරණ ගිය සැදැහැවත් ශ්‍රාවකවරු හොඳින් දනිති.

සුනක්ඛත්ත නම් වූ එක්තරා ලිච්ඡවී පුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේ ළඟ පැවිදි විය. ඔහු පසු කලක දී සිවුරු හැරියේ ය. සිවුරු හල සුනක්ඛත්ත විසාලා මහනුවර මහසෙනඟ මැදට වැදී බුදුරජාණන් වහන්සේට ගරහා විවේචනය කරන්නට පටන් ගත්තේ ය. මෙම පවිටු පුද්ගලයාගේ විවේචන එකල සිටි අන්ධ බාල පෘථග්ජනයන් හට ඉතා රසවත් වූ බවට සැක නැත. මෙම පවිටු පුද්ගලයාගේ නිර්දය විවේචන උපුටා දක්වමින් ඒ පවිටු පෘථග්ජන පිරිස බුදුරජාණන් වහන්සේට පහර ගසන්නට කොතෙකුත් ලාමක උත්සාහයන් දරන්නට ඇත.

ධර්ම සේනාධිපති සැරියුත් මහ රහතන් වහන්සේට ද පිඬු සිඟා වඩිද්දී මෙම පවිටු පුද්ගලයා මහජනයා මැදට වීත්, බුදුරජුන්ගේ ගුණ කෙලෙසන ආකාරය අසන්නට ලැබුනේ ය. සැරියුත් තෙරුන් වහන්සේ මෙකරුණ බුදුරජාණන් වහන්සේට සැළකළහ. එවිට බුදුරජාණෝ ක්‍රෝධ සහිත සිතින් යුතු සුනක්ඛත්ත මෝඝ පුරුෂයා ක්‍රෝධ සහිතව නින්දා කරන්නෙමි යි සිතා ගුණ කියනා අයුරු පෙන්වා දුන්හ. සුනක්ඛත්ත මෝඝ පුරුෂයා බුදු ගුණ හඳුනා නො ගත් බවත්, බුදුරජුන් තුළ පවතින උතුරු මිනිස්

දහම් නො දුටු බවත්, පෙන්වා දුන්හ. ඉන්පසු සාරිපුත්ත තෙරුන් වහන්සේ හට බුදුරජාණන් වහන්සේ තුළ පවතින අභීත වූ, අසාමාන්‍ය වූ, අතුල්‍ය වූ, විශාරද වූ, ගම්භීර වූ බලයන් දහයක් ඇති බවත් ඒවා තථාගත බල බවත් පෙන්වා දුන් සේක. එම තථාගත බලයන් හි පිහිටා ලෝකයා හට සත්‍යය ප්‍රකාශ කරන විට එය සියලු සතුන්ගේ නාදය අභිබවා යන සිංහනාදයක් වැනි බවත්, සියලු දේශනා ක්‍රම අභිබවා යන බ්‍රහ්ම චක්‍රයේ ප්‍රවර්තනයක් බවත් වදාළ සේක.

තමන් වහන්සේ තුළ පිහිටි ඒ තථාගත දසබල ඤාණ ගැන උන්වහන්සේ විසින් ම ඉතා පැහැදිලි ලෙස පෙන්වා වදාළ සේක.

**1. තථාගත බුදුරජාණන් වහන්සේ සිදු විය හැකි දෙය සිදු විය හැකි දෙයක් ලෙසත්, සිදු විය නො හැකි දෙය සිදු විය නො හැකි දෙයක් ලෙසත් ඒ ආකාරයෙන් ම අවබෝධ කරගෙන වැඩ සිටිති. මෙය තථාගතයන් වහන්සේ තුළ පවතින පළමු ඤාණ බලය යි.**

**2. තථාගත බුදුරජාණන් වහන්සේ අතීත, අනාගත සහ වර්තමාන යන කාලයන්ට අයත් ඕනෑම කර්මයකට ලැබෙන විපාක ගැන ඒ ඒ හේතු වශයෙන් ද, තැන් වශයෙන් ද, ඉතාමත් නිවැරදි ලෙස අවබෝධ කරගෙන වැඩ සිටිති. මෙය තථාගතයන් වහන්සේ තුළ පවතින දෙවන ඤාණ බලය යි.**

**3. තථාගත බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි ඕනෑම ආකාරයකින් ඕනෑම කෙනෙකුගේ උපතක් සිදුවන ආකාරයත්, එයට හේතු වන්නා වූ සියලු කරුණුත් ඒ ආකාරයෙන් ම අවබෝධ කරගෙන වැඩ සිටිති. මෙය තථාගතයන් වහන්සේ තුළ පවතින තුන්වන ඤාණ බලය යි.**

**4. තථාගත බුදුරජාණන් වහන්සේ ලෝක සත්වයා නොයෙකුත් ධාතු ස්වභාව වශයෙන් ගැලපී යන ආකාරය ගැනත්, එනම් සත්පුරුෂයන් සත්පුරුෂයන් සමඟ එකතු වීම, කෙලෙහි ගුණ නො දත් අසත්පුරුෂයන් එවැනි ම අසත්පුරුෂයන් හා එකතු වීම ආදී ධාතු ස්වභාවයන් ගැනත්, හොඳ හොඳ සමඟ එකතු වීම, නරක නරක සමඟ එකතු වීම ආදී ධාතු ස්වභාවයන් ගැනත් ලෝකයෙහි අනේක වූ ධාතු ස්වභාව ගැනත්, නා නා ධාතු ස්වභාව ගැනත් ඒ ආකාරයෙන් ම අවබෝධ කරගන වැඩ සිටිති. මෙය තථාගතයන් වහන්සේ තුළ පවතින**

හතරවෙනි ඤාණ බලය යි.

5. තථාගත බුදුරජාණන් වහන්සේ නොයෙක් ආකාරයේ ජීවිතවලට මේ සත්වයා සකස් වෙවී යන ආකාරයත්, මේ සත්වයන් තුළ ඇති විවිධත්වයත් ඒ ආකාරයෙන් ම අවබෝධ කරගෙන වැඩ සිටිති. මෙය තථාගතයන් වහන්සේ තුළ පවතින පස්වෙනි ඤාණ බලය යි.

6. තථාගත බුදුරජාණන් වහන්සේ ඕනෑම පුද්ගලයෙකුගේ ජීවිතයක බලපවත්වන කුසලතා දියුණු වන ආකාරයත්, පිරිහී යන ආකාරයත් පිළිබඳව ඒ ආකාරයෙන් ම අවබෝධ කරගෙන වැඩ සිටිති. මෙය තථාගතයන් වහන්සේ තුළ පවතින හයවන ඤාණ බලය යි.

7. තථාගත බුදුරජාණන් වහන්සේ ලෝක සත්වයා විසින් බණ භාවනා වශයෙන් දියුණු කරන්නා වූ ධ්‍යාන, විමෝක්ෂ, සමාධි, සමාපත්ති ආදියත්, ඒවා පිරිහීමට හේතු වන කරුණුත් එයින් අත්මිදෙන ආකාරයත්, ඒවා දියුණු කළ හැකි ආකාරයත් ඒ ආකාරයෙන් ම අවබෝධ කරගෙන වැඩ සිටිති. මෙය තථාගතයන් වහන්සේ තුළ පවතින හත්වෙනි ඤාණ බලය යි.

8. තථාගත බුදුරජාණන් වහන්සේ අතීත ජීවිත එකක් දෙකක් පමණක් නොව, සිය ගණන්, සිය දහස් ගණන්, ලක්ෂ කෝටි ගණන්, කල්ප ගණන් ගෙවා ඇති අයුරු ඒ ආකාරයෙන් ම අවබෝධ කරගෙන වැඩ සිටිති. මෙය තථාගතයන් වහන්සේ තුළ පවතින අටවෙනි ඤාණ බලය යි.

9. තථාගත බුදුරජාණන් වහන්සේ කර්මානුරූපව ලෝක සත්වයා චුත වෙන ආකාරයත්, එමෙන් ම කර්මානුරූපව ම යළි උපදින ආකාරයත්, පව් කළ උදවිය එම පව් හේතුවෙන් දුගතිය කරා යන ආකාරයත්, පින් කළ උදවිය එම පින් හේතුවෙන් සුගතිය කරා යන ආකාරයත් ඒ ආකාරයෙන් ම අවබෝධ කරගෙන වැඩ සිටිති. මෙය තථාගතයන් වහන්සේ තුළ පවතින නවවන ඤාණ බලය යි.

10. තථාගත බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ තුළ උපදවා ගන්නා ලද අතිවිශිෂ්ඨ වූ ඤාණය මෙහෙයවීමෙන් සියලු කෙලෙසුන්ගෙන් නිදහස් වී උතුම් අරහත්වයට පත් වී වදාළ බව ඒ ආකාරයෙන් ම අවබෝධ කරගෙන වැඩ සිටිති. මෙය තථාගතයන්

**වහන්සේ තුළ පවතින දසවෙනි ඤාණ බලය යි.**

මෙම දසබල ඤාණයෙන් සමන්විත වූ අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ දිව්‍ය, මනුෂ්‍ය, මාර, බ්‍රහ්ම ආදී සකලවිධ පිරිස් ඉදිරියේ විශාරදව ධර්ම දේශනා කළ අයුරු අපට සිතා ගැනීමට පවා නො හැකි තරම් ආශ්චර්යය ය. එපමණක් නොවේ, තථාගත බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ තුළ බලපවත්වන අද්විතීය වූ අසාමාන්‍ය වූ විශාරද ඤාණ හතර පිළිබඳව ද පෙන්වා වදාළ සේක.

**1. "ඔබ වහන්සේ සම්මා සම්බුද්ධ කියා ප්‍රතිඥා දෙනවා. නමුත් මේ මේ ධර්මයන් අවබෝධ කර නැත" කියා ලෝකයෙහි කිසිදු ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, දෙවියෙක් වේවා, මාරයෙක් වේවා, බ්‍රහ්මයෙක් වේවා ලෝකයෙහි වෙන කිසිවෙක් වේවා කරුණු සහිතව, උපවාද කරන්නේ ය යන්න කිසිසේත් ම සිදු නො වන දෙයකි. එබඳු චෝදනාවකට නිමිති මාත්‍රයක් වත් උන්වහන්සේ තුළ නැත. මෙය අවබෝධයෙන් ම දන්නා බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරන්නේ බිය රහිත වූ, ක්ෂේම සහිත වූ, විශාරද භාවයට පැමිණීම තුළ ය.**

**2. "ඔබ වහන්සේ නිකෙලෙස් වූ රහතන් වහන්සේ නමක් කියා ප්‍රතිඥා දෙනවා. නමුත් මේ මේ කෙලෙසුන් ප්‍රහාණය කළේ නැත" කියා ලෝකයෙහි කිසිදු ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, දෙවියෙක් වේවා, මාරයෙක් වේවා, බ්‍රහ්මයෙක් වේවා ලෝකයෙහි වෙන කිසිවෙක් වේවා කරුණු සහිතව, උපවාද කරන්නේ ය යන්න කිසිසේත් ම සිදු නො වන දෙයකි. එබඳු චෝදනාවකට නිමිති මාත්‍රයක් වත් උන්වහන්සේ තුළ නැත. මෙය අවබෝධයෙන් ම දන්නා බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරන්නේ බිය රහිත වූ, ක්ෂේම සහිත වූ, විශාරද භාවයට පැමිණීම තුළ ය.**

**3. "ඔබ වහන්සේ නිවන් මඟට අනතුරු දේ වශයෙන් යම් යම් දේ පෙන්වා දී තිබෙනවා ද, ඒ දේ සේවනය කළාට කිසි අනතුරක් නැත" කියා ලෝකයෙහි කිසිදු ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, දෙවියෙක් වේවා, මාරයෙක් වේවා, බ්‍රහ්මයෙක් වේවා ලෝකයෙහි වෙන කිසිවෙක් වේවා කරුණු සහිතව, උපවාද කරන්නේ ය යන්න කිසිසේත් ම සිදු නො වන දෙයකි. එබඳු චෝදනාවකට නිමිති මාත්‍රයක් වත්**

**උන්වහන්සේ තුළ නැත. මෙය අවබෝධයෙන් ම දන්නා බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරන්නේ බිය රහිත වූ, ක්ෂේම සහිත වූ, විශාරද භාවයට පැමිණීම තුළ ය.**

**4. "ඔබ වහන්සේ යම් ජීවිතාවබෝධයක් ඉලක්ක කොට ධර්මය දේශනා කරන නමුත්, එම ධර්මය පුරුදු පුහුණු කරන කෙනෙකුට දුකෙන් නිදහස් වීම කළ නො හැකිය" කියා ලෝකයෙහි කිසිදු ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, දෙවියෙක් වේවා, මාරයෙක් වේවා, බ්‍රහ්මයෙක් වේවා ලෝකයෙහි වෙන කිසිවෙක් වේවා කරුණු සහිතව, උපවාද කරන්නේ ය යන්න කිසිසේත් ම සිදු නො වන දෙයකි. එබඳු චෝදනාවකට නිමිති මාත්‍රයක් වත් උන්වහන්සේ තුළ නැත. මෙය අවබෝධයෙන් ම දන්නා බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරන්නේ බිය රහිත වූ, ක්ෂේම සහිත වූ, විශාරද භාවයට පැමිණීම තුළ ය.**

මොහොතක් සිතා බලන්න. මෙවැනි අනාවරණ ඤාණයෙන් යුතු බුදුරජාණන් වහන්සේ පිළිබඳව අඩු ගණනේ අපගේ සිත වත් පහදවා ගත යුතුය. උන්වහන්සේ විසින් වදාරන ලද දුක ආර්ය සත්‍යයකි. එය අවබෝධ කළ යුතු දෙයකි කියා අඩු ගණනේ අපගේ සිත වත් පහදවා ගත යුතුය. උන්වහන්සේ විසින් වදාරන ලද දුක හටගන්නට හේතුවූ අවිද්‍යා, තෘෂ්ණා ආදිය දුක්ඛ සමුදය ආර්ය සත්‍යයකි. එය ප්‍රහාණය කළ යුතු දෙයකි කියා අඩු ගණනේ අපගේ සිත වත් පහදවා ගත යුතුය. උන්වහන්සේ විසින් වදාරන ලද දුක නිරුද්ධ වීම ආර්ය සත්‍යයකි. එය විද්‍යා, විමුක්ති වශයෙන් සාක්ෂාත් කළ යුතු දෙයකි කියා අඩු ගණනේ අපගේ සිත වත් පහදවා ගත යුතුය. උන්වහන්සේ විසින් වදාරන ලද දුක නිරුද්ධ වීම පිණිස පවතින ආර්ය අෂ්ඨාංගික මාර්ගය ආර්ය සත්‍යයකි. එය සීල, සමාධි, ප්‍රඥා වශයෙන් වැඩිය යුතු දෙයකි කියා අඩු ගණනේ අපගේ සිත වත් පහදවා ගත යුතුය. ගෞතම බුදු රජාණන් වහන්සේ කෙරෙහි සාධාරණ කරුණු පදනම් කොට මෙවැනි චිත්ත ප්‍රසාදයක් වත් ඇති කර ගැනීම පිණිස අපගේ කල්පනාව නො මෙහෙයවන්නේ නම් අප ලද නුවණින් ඇති ඵලය කිම?

# බුදු ගුණ වර්ණනාව

01. මහා නුවණැති හෙයින් **ධීර** නම් වූ,
02. මොහඳුර දුරලූ හෙයින් **විගතමෝහ** නම් වූ,
03. කෙලෙස් හුල් බිඳලූ හෙයින් **පභිණ්හඛිල** නම් වූ,
04. මාර සේනා ජයගත් හෙයින් **විජිතවිජය** නම් වූ,
05. කෙලෙස් දුක් රහිත හෙයින් **අනීඝ** නම් වූ,
06. සොඳුරු සමසිත් ඇති හෙයින් **සුසමචිත්ත** නම් වූ,
07. වැඩුණු සිල් ඇති හෙයින් **වෘද්ධසීල** නම් වූ,
08. සොඳුරු ප්‍රඥා ඇති හෙයින් **සාධුපඤ්ඤ** නම් වූ,
09. කෙලෙස් දුර්ගයෙන් එතෙරට වැඩි හෙයින් **වෙස්සන්තර** නම් වූ,
10. නිමල ගුණ ඇති හෙයින් **විමල** නම් වූ

**භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

11. සැකයෙන් එතෙරට වැඩි හෙයින් **අකථංකථී** නම් වූ,
12. සතුටින් පිරුණු සිත් ඇති හෙයින් **තුසිත** නම් වූ,
13. කාම ගුණ බැහැර කළ හෙයින් **වංතලෝකාමිස** නම් වූ,
14. ලොවේ යහපත දැක සතුටු වන හෙයින් **මුදිත** නම් වූ,
15. ශ්‍රමණ ගුණ සපුරා ගත් හෙයින් **කතසමණ** නම් වූ,
16. උතුම් මිනිසෙක් හෙයින් **මනුජ** නම් වූ,
17. අවසන් සිරුර දරනා හෙයින් **අන්තිමසාරීර** නම් වූ,
18. උදාර මිනිසෙක් හෙයින් **නර** නම් වූ,
19. අලාමක සිත් ඇති හෙයින් **අනෝම** නම් වූ,
20. කෙලෙස් දුහුවිලි නැති හෙයින් **විරජ** නම් වූ

**භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

21. සංකා රහිත සිත් ඇති හෙයින් **අසංසය** නම් වූ,
22. හැමට යහපත සදනා හෙයින් **කුල** නම් වූ,
23. ලෝ සතුන් දමනය කරනා හෙයින් **වේණයික** නම් වූ,
24. දහමේ මැනවින් හික්මවන උතුම් රථාචාර්යා බඳු හෙයින් **සාරථිවර** නම් වූ,
25. උදාර ගුණ ඇති හෙයින් **අනුත්තර** නම් වූ,
26. පිරිසිදු දහම් ඇති හෙයින් **රුචිරධම්ම** නම් වූ,
27. නිසැක ගුණ ඇති හෙයින් **නික්කංඛ** නම් වූ,
28. නුවණින් ලොව එළිය කරනා හෙයින් **පභාසකර** නම් වූ,
29. මානය සිඳලූ හෙයින් **මානච්ඡිද** නම් වූ,
30. මහා වීර ගුණ ඇති හෙයින් **වීර** නම් වූ

**භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

31. අසම ගුණ ඇති හෙයින් **නිසභ** නම් වූ,
32. පමණ කළ නො හැකි ගුණ ඇති හෙයින් **අප්පමෙය්‍ය** නම් වූ,
33. ගැඹුරු නුවණැති හෙයින් **ගම්භීර** නම් වූ,
34. මුනි දහමට පත් වූ හෙයින් **මෝනපත්ත** නම් වූ,
35. බිය රහිත ගුණයෙන් යුතු හෙයින් **ඛේමංකර** නම් වූ,
36. ලොවෙහි දෙවියන් බඳු හෙයින් **දේව** නම් වූ,
37. ධර්මයෙහි පිහිටි හෙයින් **ධම්මට්ඨ** නම් වූ,
38. සංවර සිත් ඇති හෙයින් **සංවුතත්ත** නම් වූ,
39. කෙලෙස් ඉක්ම ගිය හෙයින් **සංඝාතික** නම් වූ,
40. දුකින් නිදහස් වූ හෙයින් **මුත්ත** නම් වූ

**භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

41. මහා ඇත් රජෙකු වැනි හෙයින් **නාග** නම් වූ,
42. ඈත වනයේ වසනා හෙයින් **පංතසේන** නම් වූ,
43. කෙලෙස් බැඳීම් ගෙවා දැමූ හෙයින් **ඛීණසංයෝජන** නම් වූ,
44. කෙලෙසුන්ගෙන් නිදහස් වූ හෙයින් **මුත්ත** නම් වූ,
45. නුවණින් යුතු කථාබහ ඇති හෙයින් **පටිමංතක** නම් වූ,
46. කෙලෙස් සෝදා හළ හෙයින් **ධෝණ** නම් වූ,
47. මානධජ බිම හෙලූ හෙයින් **පන්නද්ධජ** නම් වූ,

48. වීතරාගී හෙයින් **වීතරාග** නම් වූ,
49. දමනය වූ හෙයින් **දමිත** නම් වූ,
50. කෙලෙස් සිතිවිලි රහිත වූ හෙයින් **නිප්පපංච** නම් වූ

**භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

51. සත් බුදුවරුන් අතරේ සත් වැනි මහා ඍෂි වූ හෙයින් **ඉසිසත්තම** නම් වූ,
52. කුහක ගති නැති හෙයින් **අකුහ** නම් වූ,
53. ත්‍රිවිද්‍යාව ලද හෙයින් **තේවිජ්ජ** නම් වූ,
54. ශ්‍රේෂ්ඨත්වයට පත් වූ හෙයින් **බ්‍රහ්මපත්ත** නම් වූ,
55. කෙලෙස් සෝදා හළ හෙයින් **නහාතක** නම් වූ,
56. දහම් පද මැනවින් දෙසනා හෙයින් **පදක** නම් වූ,
57. සැහැල්ලු සිත කය ඇති හෙයින් **පස්සද්ධ** නම් වූ,
58. දුටු දහම් ඇති හෙයින් **විදිතවේද** නම් වූ,
59. හැමට පළමුව ධර්ම දානය බෙදා දුන් හෙයින් **පුරින්දද** නම් වූ,
60. සියලු ගුණයට දක්ෂ හෙයින් **සක්ක** නම් වූ

**භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

61. ආර්ය ගුණ ඇති හෙයින් **අරිය** නම් වූ,
62. වඩන ලද සිත් ඇති හෙයින් **භාවිතත්ත** නම් වූ,
63. උතුම් ගුණයට සපැමිණි හෙයින් **පත්තිපත්ත** නම් වූ,
64. දහම මැනවින් තෝරා දෙන හෙයින් **වෙය්‍යාකරණ** නම් වූ,
65. මනා සිහි නුවණ ඇති හෙයින් **සතිමා** නම් වූ,
66. නුවණින් ලොව දක්නා හෙයින් **විපස්සී** නම් වූ,
67. රහත් ගුණයෙන් යුතු හෙයින් **අනභිනත** නම් වූ,
68. සියලු නුගුණින් බැහැර වූ හෙයින් **අනපණත** නම් වූ,
69. තෘෂ්ණා නැති හෙයින් **අනේජ** නම් වූ,
70. වසඟ කළ සිත් ඇති හෙයින් **වසිප්පත්ත** නම් වූ

**භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

71. යහපත් මග වැඩි හෙයින් **සම්මග්ගත** නම් වූ,
72. ධ්‍යාන වඩනා හෙයින් **ඣායී** නම් වූ,
73. කෙලෙස් හා එක් නො වූ සිත් ඇති හෙයින් **අනනුගතන්තර**

නම් වූ,
74. පාරිශුද්ධ සිත් ඇති හෙයින් **ශුද්ධ** නම් වූ,
75. කෙලෙස් රහිත හෙයින් **අසිත** නම් වූ,
76. නැති නො වන ගුණයෙන් හෙයින් **අප්පහීණ** නම් වූ,
77. හුදෙකලාවේ ඇලුණු සිත් ඇති හෙයින් **පවිවිත්ත** නම් වූ,
78. ලොවෙහි මුදුනට පත් වූ හෙයින් **අග්ගපත්ත** නම් වූ,
79. සසරෙන් එතෙරට වැඩි හෙයින් **තිණ්ණ** නම් වූ,
80. අනුන් එතෙර කරවන හෙයින් **තාරයන්ත** නම් වූ

**භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

81. ශාන්ත විහරණ ඇති හෙයින් **සන්ත** නම් වූ,
82. ගම්භීර ප්‍රඥා ඇති හෙයින් **භූරිපඤ්ඤ** නම් වූ,
83. මහා ප්‍රඥා ඇති හෙයින් **මහාපඤ්ඤ** නම් වූ,
84. ලෝභය දුරු වී ඇති හෙයින් **වීතලෝභ** නම් වූ,
85. සත්‍යයට පත් වූ හෙයින් **තථාගත** නම් වූ,
86. සොඳුරු ගමනක් වැඩි හෙයින් **සුගත** නම් වූ,
87. එවැනි වෙන කෙනෙකු නැති හෙයින් **අප්පටිපුග්ගල** නම් වූ,
88. සමාන කෙනෙක් නැති හෙයින් **අසම** නම් වූ,
89. විශාරද ඤාණ ඇති හෙයින් **විසාරද** නම් වූ,
90. සියුම් නුවණැති හෙයින් **නිපුණ** නම් වූ

**භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

91. තණ්හාව සිඳලූ හෙයින් **තණ්හච්ඡිද** නම් වූ,
92. අවබෝධයට පත් වූ හෙයින් **බුද්ධ** නම් වූ,
93. කෙලෙස් දුම් බැහැර කළ හෙයින් **වීතධූම** නම් වූ,
94. කෙලෙස් හා නො තැවරී සිටිනා හෙයින් **අනුපලිත්ත** නම් වූ,
95. පුද පූජාවන්ට සුදුසු හෙයින් **ආහුණෙය්‍ය** නම් වූ,
96. ශ්‍රේෂ්ඨ උතුමෙකු හෙයින් **යක්ඛ** නම් වූ,
97. උතුම් පුද්ගලයෙකු හෙයින් **උත්තමපුග්ගල** නම් වූ,
98. අසාමාන්‍ය ගුණ ඇති හෙයින් **අතුල** නම් වූ,
99. මහා ගුණ ඇති හෙයින් **මහා** නම් වූ,
100. මහා යසසට පත් වූ හෙයින් **මහතෝයසග්ගපත්ත** නම් වූ

**භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

# අඳුරු ලොව එළිය කළ...

1. අඳුරු ලොව එළිය කළ - මගේ සිත පහන් කළ
සැප සතුට උදා කළ - මගේ බුදු සමිඳුනේ

2. නො මග යන විට හැඳින සුමගට ම යොමු කරන
මහා කරුණා ගුණැති - කාරුණික සමිඳුනේ

3. මැරෙන ඉපදෙන ලොවෙන් සදහට ම මිදෙන්නට
අම නිවන් මග දෙසන - සුගත බුදු සමිඳුනේ

4. ජීවිතේ දුක් තැවුල් - පිස දමා සනසවා
අමා ඔසු ලබා දෙන - මගේ බුදු සමිඳුනේ

5. හුදෙකලා දිවි මගක - දහම තුළ තනි නො වන
පිළිසරණ ලබා දෙන - කාරුණික සමිඳුනේ

6. රැවටෙමින් මේ ලොවට - සැප සොයා දුවන විට
ප්‍රඥාව ලබා දුන් - මගේ බුදු සමිඳුනේ

7. දුකෙන් මුදවා සැවො ම - සනාතන සැපය දෙන
මගේ ලොව හිරු මඬල - ඔබයි බුදු සමිඳුනේ

8. මඩ දියෙන් උඩට නැගී සුපිපි නෙළුමක් විලස
දම් සුවඳ බෙදා දෙන - මලක් වෙමි සමිඳුනේ

9. සරුසාර පොළොව මත - වැඩෙන සරු පැලය ලෙස
මුළු ලොවට සෙවන දී - වැඩෙමි බුදු සමිඳුනේ

10. අහස් කුස එළිය කොට - සුපුන් සඳ දිලෙන විට
එළිය විහිදා දිලෙන - තරුව වෙමි සමිඳුනේ

11. සැදැහැසිත් සදාගෙන - සිල් සුවඳ දරාගෙන
ඔබේ සිරිපා සෙවනෙ - වැඩෙමි බුදු සමිඳුනේ

12. අඳුර විනිවිද දිලෙන - නැණ පහන දරාගෙන
ලොවෙහි ඇති තතු එලෙස - දකිමි බුදු සමිඳුනේ

13. වෙනස් වන ලෝ දහම - සියළු තැන දකින විට
උතුම් සම්බුදු සුවඳ - සිහි කරමි සමිඳුනේ

14. නොසෙල්වෙන පහන් සිළ - එක්තැන්ව දිලෙන ලෙස
මමත් සිත සමාහිත - කරමි බුදු සමිඳුනේ

15. දුක් විඳින ලෝකයට - ඇති ඇල්ම බැහැර කොට
හැම දුකින් අත්මිදෙන - මග දකිමි සමිඳුනේ

16. මේ වෙසක් පොහො දිනේ - බුදු ගුණය සිතමිනේ
ගඳකිලිය ලෙස මහද - පුදමි බුදු සමිඳුනේ

17. ඔබේ බුදු සසුනෙ දි ම - ඒ අමා නිවන දැක
පිළිසරණ ලබන්නට - පතමි බුදු සමිඳුනේ

*සාදු ! සාදු !! සාදු !!!*






හැම දෙයකට ම මුල් වන්නේ සිත යි. සිත තමයි ශ්‍රේෂ්ඨ වන්නෙත්. ඉතින් පින් පව් කියන හැම දේ ම හැදෙන්නෙත් සිතෙන් ම යි. යම් කෙනෙක් පහන් වූ සිතින් යමක් කියනවා නම්, කරනවා නම් ඒ පින ඔහු පසුපස්සේ පැමිණෙන්නේ සෙවණැල්ල වගෙයි.

අපටත් සිතක් තියෙනවා. අපේ ජීවිතයේ කරන, කියන සෑම දෙයට ම මුල් වෙන්නෙත් ඒ සිත ම යි. සිත කිලුටු වුණොත් කිලුටු වන්නේ ලාමක අකුසල් සමඟ මේ සිත එක් වීම නිස යි. කෙනෙකුට තම සිතේ ඇතිවෙන ලාමක අකුසල් හඳුනාගන්නට බැරි වුණොත් ඒ කෙනා ඒ අකුසල් වලින් කිලුටු වී ගිය සිතින් යුතුව කටයුතු කරනවා. එතකොට එය තමන්ට හිත සුව පිණිස පවතින්නේ නැහැ. අපේ සිතේ එබඳු දෙයක් ඇති වුණොත් වහාම එයින් මේ සිත මුදවා ගන්නට ඕන.

සිතක කුසල් ඇති වීම ඉතාමත් ම පින්බර දෙයක්. ඒ සඳහා නුවණින් මෙනෙහි කිරීම අත්‍යවශ්‍ය යි. එබඳු කෙනෙකුට සිත පහදවා ගන්න පුළුවන්. පින්වතුනේ, පින්වත් දරුවනේ, ඉතින් මේ සිත පහදවා ගැනීම අප කළ යුත්තේ මෙතෙක් ලොව පහළ වූ වඩාත් ම අනර්ඝ වූ කරුණු තුනක් සම්බන්ධව යි.

මෙම මානව ඉතිහාසයේ පහළ වූ ඉතාමත් ම ආනුභාව සම්පන්න, ගම්භීර ප්‍රඥාවෙන් යුතු, මහා පුරුෂෝත්තමයාණන් වන ගෞතම බුදුරජාණන් වහන්සේගේ නිර්මල සිත ගැනත්, විශ්මිත අවබෝධය ගැනත්, අසිරිමත් චරිතාපදානය ගැනත්, අසාමාන්‍ය දේශනා කෞශල්‍ය ගැනත්, මහා කරුණාව ගැනත් ඔබේ සිතේ

පැහැදීමක් ඇතිවෙනවා නම් එය ඔබ තුළ ඇතිවෙන පුණ්‍යාලෝකයේ පැහැදිලි නිමිත්තයි. එම චිත්තප්‍රසාදය විසින් ඔබව බුද්ධිමතුන්ගේ ලොවක් කරා කැඳවා ගෙන යනවා.

ඒ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාරණ ලද්දේ පොත් පත් රාශියක් කියවීමෙන් ඇති කර ගත් ශාස්ත්‍රීය දැනුමකින් හෙබි මත ගොඩක් නො වෙයි. උන්වහන්සේ දේශනා කරන ලද ධර්මයේ ස්වභාවය උන්වහන්සේ විසින් ම පෙන්වා දුන්නේ මේ ආකාරයට යි.

"පින්වත් මහණෙනි, මා ධර්මය දේශනා කරන්නේ විශිෂ්ඨ වූ ඤාණයකින් අවබෝධ කරගෙන යි. අනවබෝධයෙන් නො වේ. පින්වත් මහණෙනි, මා ධර්මය දේශනා කරන්නේ හේතු සහිතව යි, හේතු රහිතව නොවේ. පින්වත් මහණෙනි, මා ධර්මය දේශනා කරන්නේ ප්‍රාතිහාර්යය සහිතවයි, ප්‍රාතිහාර්යය රහිතව නොවේ.

පින්වත් මහණෙනි, මා විසින් අනවබෝධයෙන් නොව, විශිෂ්ඨ වූ ඤාණයෙන් ලත් අවබෝධයෙන් ම ධර්මය දේශනා කරන විට, හේතු රහිතව නොව හේතු සහිතව ම ධර්මය දේශනා කරන විට, ප්‍රතිහාර්යය රහිතව නොව ප්‍රාතිහාර්ය සහිතව ම ධර්මය දේශනා කරන විට ඒ මාගේ දහම් අවවාදය කළ යුතුය. මාගේ අනුශාසනාව කළ යුතුය.

පින්වත් මහණෙනි, ඔබට බොහෝ ම සතුටු වන්නට පුළුවනි. පහන් සිත් ඇති කරගන්නට පුළුවනි. සොම්නසට පත් වන්නට පුළුවනි. "භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ යි, ධර්මය ස්වාක්ඛාත යි, ශ්‍රාවක සංඝයා සුපටිපන්න යි" කියල."

*- අංගුත්තර නිකාය - තික නිපාතය - භරණ්ඩු වර්ගය*

මෙයින් අපට පැහැදිලිව පෙනෙන්නේ බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාරණ ලද ධර්මය නිකම් ම නිකං කියාගෙන යෑමක් නොවෙයි. එය අන් අයට ඒකාන්තයෙන් ම ජීවිතාවබෝධය පිණිස උපකාර වන බුදුරජාණන් වහන්සේ ඒ අවබෝධයෙන් ම දේශනා කරන ලද ධර්මයේ ඇති ආශ්චර්යය උන්වහන්සේ විසින් ම මේ අයුරින් ම පෙන්වා දෙනවා.

"පින්වත් මහණෙනි, මේ ලෝක සත්වයා සිටින්නේ ආශාව තුළ යි. ඇලී සිටින්නෙත් ආශාවට යි. සතුටු වන්නෙත් ආශාව තුළින්. නමුත් තථාගතයන් වහන්සේ ආශාව දුරු කිරීම ගැන ධර්මය දේශනා කරද්දී, එය අසන්නට කැමති වෙනවා. සවන් යොමනවා. අවබෝධ කිරීම පිණිස සිත පිහිටුවාගන්නවා. පින්වත් මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමකගේ පහල වීම නිසයි, මෙම ආශ්චර්ය වූ දෙය සිදුවන්නේ.

පින්වත් මහණෙනි, මේ ලෝක සත්වයා සිටින්නේ මාන්නය තුළ යි. ඇලී සිටින්නෙත් මාන්නයට යි. සතුටු වන්නෙත් මාන්නය තුළින්. නමුත් තථාගතයන් වහන්සේ මාන්නය දුරු කිරීම ගැන ධර්මය දේශනා කරද්දී, එය අසන්නට කැමති වෙනවා. සවන් යොමනවා. අවබෝධ කිරීම පිණිස සිත පිහිටුවාගන්නවා. පින්වත් මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමකගේ පහල වීම නිසයි, මෙම ආශ්චර්ය වූ දෙය සිදුවන්නේ.

පින්වත් මහණෙනි, මේ ලෝක සත්වයා සිටින්නේ නො සන්සිඳීම තුළ යි. ඇලී සිටින්නෙත් නො සන්සිඳීමට යි. සතුටු වන්නෙත් නො සන්සිඳීගිය සිත තුළිනුයි. නමුත් තථාගතයන් වහන්සේ සන්සිඳීම ඇති කරවන ධර්මය දේශනා කරද්දී, එය අසන්නට කැමති වෙනවා. සවන් යොමනවා. අවබෝධ කිරීම පිණිස සිත පිහිටුවාගන්නවා. පින්වත් මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමකගේ පහල වීම නිසයි, මෙම ආශ්චර්ය වූ දෙය සිදුවන්නේ.

පින්වත් මහණෙනි, මේ සත්ව ප්‍රජාව සිටින්නේ අවිද්‍යාව තුළ යි. බිත්තර කටුවකින් වැසී තිබෙන ජීවිතයක් වගෙයි අවිද්‍යාවෙන් වැහිලයි ඉන්නේ. නමුත් තථාගතයන් වහන්සේ අවිද්‍යාව දුරු කිරීම ගැන ධර්මය දේශනා කරද්දී, එය අසන්නට කැමති වෙනවා. සවන් යොමනවා. අවබෝධ කිරීම පිණිස සිත පිහිටුවාගන්නවා. පින්වත් මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමකගේ පහල වීම නිසයි, මෙම ආශ්චර්ය වූ දෙය සිදුවන්නේ."

*- අංගුත්තර නිකාය - චතුක්ක නිපාතය - දුතිය තථාගත අච්ඡරිය සූත්‍රය*



ඒ තථාගතයන් වහන්සේ විසින් මෙතරම් ම ආශ්චර්යවත් ව වදාරණ ලද ධර්මය කුමක් ද? එනම්, චතුරාර්ය සත්‍යය යි. ඒ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කිරීමේ කුසලතාවය බුද්ධිමත් මනුෂ්‍යයන් තුළ තියෙනවා. එය විවෘත වන්නේ සිත පැහැදීම තුළ යි. බුදුරජාණන් වහන්සේ වදාරණ ලද ඒ අමා නිවන් මග මැනවින් සවන් දුන් කෙනෙකු තුළ ඒ කෙරෙහි තම සිත පහදී නම් ඔහු නුවණ මෙහෙය වන කෙනෙක් විනා අන් කවරෙක් ද? එනිසා බුදුරජාණන් වහන්සේ ගැන සිත පහදවා ගැනීම ම යහපති. ඒ ශ්‍රී සද්ධර්මය ගැන සිත පහදාවා ගැනීම ම යහපති. ඒ ආර්ය ශ්‍රාවක සංඝරත්නය ගැනත් සිත පහදවා ගැනීම ම යහපති.

**ඔබට මේ ගෞතම බුදු සසුනේ චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමේ වාසනාව උදාවේවා!**

# මෛත්‍රී ශාන්තිය

1. සැප විඳින්නට තමන් - කැමති බව දකින්නේ
එලෙසින් ම ලෝ සතුන් - සැපයමයි පතන්නේ
තමා උපමා කරන් - හැම සතුන් දකින්නේ
සියලු ලෝ සතුන් වෙත - මෙත් සිතයි වඩන්නේ

2. මා නිතර සැප ලබා - නිදුකින් ම වෙසේවා
සෝක දුක් තැවුල් නැති - සැනසීම ලැබේවා
මා අතින් කිසිවෙකුට - කිසි දුකක් නො වේවා
සැමට සෙත සදන්නට - ගුණ නුවණ වැඩේවා

3. මගේ හිතවත් පිරිස - නිදුකින් ම වෙසෙත්වා
දුක් විපත් වලින් තොර - යහපත ම ලබත්වා
දුරු වෙමින් බාධක ද - නිතර සැප ලබත්වා
හැම දෙනා තුළ සතුට - සැනසීම වැඩෙත්වා

4. මැදහත්ව සිටින අය - මෙත් සිත ම වඩත්වා
දුක් තැවුල් නැති සිතින් - තුටින් කල් ගෙවත්වා
ලබා යහපත ලොවේ - සැනසීම ලබත්වා
ලොවට සෙත සදන්නට - ගුණ නුවණ වැඩෙත්වා

5. මට වෛර කරන අය - සිහි නුවණ ලබත්වා
වෛර සිත් බැහැර කොට - මෙත් සිත ම වඩත්වා
ඉරිසියාවෙන් පෙළෙන - දුක් තැවුල් නො වෙත්වා
ඒ සියලු දෙනා ලොව - සැප සතුට ලබත්වා

6. මා අවට සිටින අය - මෙත් සිත ම වඩත්වා
සෝක දුක් තැවුල් නැති - සැනසීම ලබත්වා
ගුණ නුවණ හා සිල් ද - සැදැහැ සිත් වඩත්වා
සැමට සෙත සදන්නට - නුවණ යොමු කෙරෙත්වා

7. මේ ගමේ සිටින අය - නගරයේ සිටින අය
මේ පළාතේ සිටින - රටේ පැතිරී සිටින
හැම දෙනා තුළ නිතර - මෙත් සිත ම වැඩෙත්වා
කරුණාව පැතිර ගිය - ගුණ නුවණ ලබත්වා

8. ජාති කුල භේද හැම - සිතින් දුරු වී ගොසින්
සිටිත්වා සියලු දෙන - මවගෙ දරු කැල ලෙසින්
අකමැතිව කිසි දුකක් - කිසිවෙකුට කිසි ලෙසින්
ලබත්වා සියලු දෙන - මෙත් සිත ම මේ ලෙසින්

9. දෙපා ඇති නැති සතුන් - ලොවේ සිවුපා සතුන්
පෙනෙන නො පෙනෙනා ලොව - කල් ගෙවන හැම සතුන්
දුරින් හා ළඟ සිටින - දෙව් මිනිස් හැම සතුන්
වඩත්වා මෙත් සිත ම - මේ සියලු ලෝ සතුන්

10. උතුරු හා නැගෙනහිර - දකුණු බටහිර දෙසේ
ලොව පුරා පැතිර සිටි - සතුන් වෙති හැම දෙසේ
මේ සියලු ලෝ සතුන් - ලබා සැප නිසි ලෙසේ
වැඩෙත්වා මෙත් සිතින් - සැප සතුට ලැබෙන සේ

11. එකිනෙකා තුළ නිතර - මෙත් සිත ම වැඩෙත්වා
නිහතමානී සිතින් - සමඟියෙන් සිටිත්වා
අනුන්ගේ වැරදි නොව - හොඳ දෙය ම දකිත්වා
ගුණෙන් නුවණින් වැඩී - සියලු සැප ලබත්වා

12. කයින් කරනා දෙයින් - හොඳ දෙය ම කරත්වා
වචනයෙන් කියන දෙය - සමඟිය ම වඩත්වා
සිතින් සිතනා දෙයින් - යහපත ම සිතත්වා
ලොවේ සියලුම සතුන් - සැප සතුට ලබත්වා

13. ගුරුවරුන් මා පියන් - හා ලොවේ ගුණැතියන්
වෙසෙත්වා සියලු කල - නිවී සැනසුන සිතින්
දූ පුතුන් හා සොයුරු - සිසුන් හා සිසුවියන්
වෙසෙත්වා කීකරුව - නිහතමානී සිතින්

14. අහසෙ පොළොවේ සිටින - පිනැති දෙවියන් බඹුන්
වෙසෙත්වා සියලු කල - දියුණු කළ මෙත් සිතින්
ඒ සියලු දෙවි බඹුන් - යොමා කරුණා නෙතින්
රකිත්වා හැම ලෙසින් - සිල්වතුන් ගුණවතුන්

15. ලොවේ වෙසෙනා සියලු - ලෝ සතුන් දෙවි බඹුන්
ලබත්වා සැප සතුට - රැස් කරන හැම පිනෙන්
සමාධිය හා නුවණ - සිල් ගුණය යුතු සිතින්
ලබත්වා අම නිවන - නිවී සැනසුන සිතින්

*සාදු ! සාදු !! සාදු !!!*






- මේ බුදු සසුනේ පුහුණු කරන්ට ඕනෑ සීලය ම යි. මේ ජීවිතයේ දී හොඳට සිල් රැක ගත්තොත් සියළු සම්පත් ලැබෙනවා.

- නුවණ තියෙන කෙනා සිල් රකින්ට ඕනෑ සැප තුනක් බලාගෙන. ඒ තමයි ප්‍රශංසාව, ධන ලාභය වගේ ම සුගතියේ ඉපදිලා සතුටු වීම.

- සිල් රකින කෙනාගේ සංවර ජීවිතය නිසා එයාට ගොඩක් හොඳ මිතුරන් ලැබෙනවා. ඒ වුණාට දුස්සීල කෙනා පාපී ක්‍රියා නිසා හොඳ මිතුරන් ගෙන් ඈත් වෙනවා.

- දුස්සීල කෙනා ලබන්නේ ගැරහීමත්, අපකීර්තියත් විතරයි. සිල්වත් කෙනා හැම තිස්සෙ ම ගුණ කථාවත්, ප්‍රශංසාවත් ලබනවා.

- මුලින් ම පිහිට වෙන්නෙ ශීලය යි. ශීලය කියන්නේ යහපත් ගතිගුණවලට අම්ම කෙනෙක් වගේ දෙයක්. සියළු ගුණ ධර්මවල ප්‍රමුඛයා ශීලය යි. එනිසා ශීලය පිරිසිදුව තබා ගන්ට ඕනෑ.

- සිත මහ මුහුද නම් ශීලය වෙරළයි. සතුටත් සංවරයත් ලබාදෙන ශීලය හැම බුදුවරුන්ගේ ම පුණ්‍ය තීර්ථය යි. ඒ නිසා ශීලය පිරිසිදුව තියෙන්නට ඕනෙ.

- ශීලය කියන්නේ අසහාය බලයක්. උත්තම ආයුධයක්. ලස්සන ආභරණයක්. අද්භූත ඇඳුමක්.

● සීලය කියන්නෙ මහේශාක්‍ය පාලමක්. අති උතුම් සුවඳක්. දස දිශාවට ම හමාගෙන යන ශ්‍රේෂ්ඨ සුවඳ විලවුන් කියන්නෙ සීලයට යි.

● සීලය කියන්නෙ ගමනක් යන කෙනෙකුගේ රසවත් බත් මුලක්. උතුම් ගමනකට හොඳ වියදමක්. දස දිශාවේ ගමන් කළ හැකි හොඳ වර්ගයේ වාහනයක්.

● ජීවිතය නපුරු කර ගත්තොත් මේ ජීවිතයේ දී ම නින්දා ලැබෙනවා. පරලොව දී ත් අපායේ ඉපදිලා දුක් විඳින්ට සිදුවෙනවා. සීලයක් නැති, එකඟ වූ සිතක් නැති, අඥාන පුද්ගලයා හැම තැනකදී ම දුකට ගොදුරු වෙනවා.

● ජීවිතය යහපත් කර ගත්තොත් මේ ජීවිතයේ දී ම කීර්තිය ලැබෙනවා. පරලොව දී සුගතියේ ඉපදිලා සතුටු වෙනවා. සිල් රැකලා සිත එකඟ කර ගෙන නුවණ ලබාගත් කෙනා හැම තැනකදීම සතුටු වෙනවා.

● මේ ශාසනයේ සීලය අග්‍ර දෙයක්. නමුත් උතුම් ම දෙය ප්‍රඥාවයි. මිනිසුන් අතරත් දෙවියන් අතරත් සීලයත් ප්‍රඥාවත් යන දෙකෙන් ජය ලබන්ට පුළුවනි.

**මෙය වනාභී සීලව නම් රහත් මුනිඳුන් වදාළ ගාථාවන් ය.**




**(01) චක්කවරංකිතරත්තසුපාදෝ**
**ලක්ඛණ මණ්ඩිත ආයතපණ්හී**
**චාමරඡත්තවිභූසිතපාදෝ**
**ඒහි හි තුය්හ පිතා නරසීහෝ**

රත්පැහැයෙන් සිරිපා යුග දිලෙනා
සක ලකුණින් දික් විළුඹින් සැදුනා
චාමර සක් සිරියෙන් ද බැබලෙනා
අන්න බලන් පුත සමිඳුන් වඩිනා

**(02) සක්‍යකුමාරවරෝ සුඛුමාලෝ**
**ලක්ඛණචිත්තිතපුණ්ණසරීරෝ**
**ලෝකහිතාය ගතෝ නරවීරෝ**
**ඒහ හි තුය්හ පිතා නරසීහෝ**

ශාක්‍ය කුලේ සියුමැලි කුමරාණෝ
සොඳුරු ලකුණු පිරි පින් සිරුරාණෝ
ලොව සෙතට ම වැඩි වීර නරාණෝ
අන්න බලන් සම්බුදු සමිඳාණෝ

**(03) පුණ්ණසසංකනිභෝමුඛවණ්ණෝ**
**දේවනරාන පියෝ නරනාගෝ**
**මත්තගජින්දවිලාසිතගාමී**
**ඒහි හි තුය්හ පිතා නරසීහෝ**

පුන් සඳ සේ බබලන නිල් අහසේ
දෙව් මිනිසුන් නෙත් සනසන සිත් සේ
වඩින ගමන ඇත් රජුගෙ විලාසේ
නරඹනු පුත සමිඳාණන් සිත් සේ

**(04) ඛත්තියසම්භවඅග්ගකුලීනෝ**
**දේවමනුස්සනමස්සිතපාදෝ**
**සීලසමාධිපතිට්ඨිතචිත්තෝ**
**ඒහි හි තුය්හ පිතා නරසීහෝ**

රජ කුලයේ බුදු සමිඳු උපන්නේ
දෙව් මිනිසුන් පා යුග නමදින්නේ
සිල් සමාධි සිත තුළ පිහිටන්නේ
අන්න බලන් බුදු සමිඳු වඩින්නේ

**01) ආයතතුංග සුසණ්ඨිතනාසෝ**
**ගෝපඛුමෝ අභිනීලසුනෙත්තෝ**
**ඉන්දධනූ අභිනීලභමූකෝ**
**ඒහි හි තුය්හ පිතා නරසීහෝ**

නිල්වන් පාටින් නෙත් යුග දිලෙනා
තුන්ග සුසන්ඨිත නාසය තිබෙනා
ඇහිබැම දේදුනු යුගල විලසිනා
අන්න බලන් පුත සමිඳුන් වඩිනා

**01) වට්ටසුමට්ටසුසණ්ඨිතගීවෝ**
**සීහහනූ මිගරාජසරීරෝ**

**කඤ්චනසුච්ඡවි උත්තමවණ්ණෝ**
**ඒහි හි තුය්හ පිතා නරසීහෝ**

බබලන තෙද සිහ රජෙකුගෙ වැන්නේ
සියුමැලි බව මුව රජෙකුගෙ වන්නේ
පින්වත් රැස් සිරුරින් විහිදෙන්නේ
අන්න පුතේ බුදු සමිඳු වඩින්නේ

(07) **සිනිද්ධ සුගම්භිරමඤ්ජුසුඝෝසෝ**
**හිංගුලබන්ධුසුරත්තසුජිව්හෝ**
**වීසති වීසති සේතසුදන්තෝ**
**ඒහි හි තුය්හ පිතා නරසීහෝ**

සිනිදු සොඳුරු මිහිරෙන් හඬ නැගෙනා
සිත සැනසෙන සම්බුදු බණ ඇසෙනා
සුමුදු සිනා රැස් මුහුණේ රැඳෙනා
අන්න පුතේ බුදු සමිඳු වඩින්නේ

(08) **අඤ්ජනවණ්ණසුනීලසුකේසෝ**
**කඤ්චනපට්ඨවිසුද්ධලලාටෝ**
**ඕසධිපණ්ඩරසුද්ධසුඋණ්ණෝ**
**ඒහි හි තුය්හ පිතා නරසීහෝ**

නිල් පාටින් සිරසේ කෙස් බැබළේ
රන්වන් රැස් විහිදෙනවා නළලේ
ඌර්ණා රෝම ධාතුව වත කමලේ
බුදු සමිඳුගෙ මුළු සිරුර ම බැබළේ

(09) **ගච්ඡති නීලපථේ විය චන්දෝ**
**තාරගණා පරිවේඨිතරූපෝ**
**සාවකමජ්ඣගතෝ සමණින්දෝ**
**ඒහි හි තුය්හ පිතා නරසීහෝ**

නිල් අහසේ පුන් සඳ පායන්නේ
සඳවට කොට රන් තරු බැබලෙන්නේ
මුණිසඳ ශ්‍රාවක මැද සුදිලෙන්නේ
අන්න පුතේ බුදු සමිඳු වඩින්නේ






(01). සංසාරේ දුක දැකලා කලකිරුණා අම්මේ
ඒ හින්දයි පැවිදි වෙන්න හිත නැමුනේ අම්මේ
බුදු සසුනක් මුණ ගැසුනේ කලකින්නේ අම්මේ
නිවන් දකින මග ලැබුනා විරිය වඩමු අම්මේ

(02). පැවිදි වෙන්න මා ආ පසු ඇයි අඬන්නෙ අම්මේ
සංසාරේ හෙලු කඳුලැලි මතක නැද්ද අම්මේ
තණ්හාවෙන් හදනා දුක හඳුනාගෙන අම්මේ
වෙර වඩන්න මේ සසරින් ගැලවෙන්නට අම්මේ

(03). ලේ කිරිකර මට පොවලා මා හැදු මගෙ අම්මේ
නිදි වරමින් ලෙඩට දුකට බෙහෙත් කෙරුව අම්මේ
අහිතක් නෑ අම්මා ගැන මා හැදු වැඩු අම්මේ
සංසාරේ දුක ඇහුව ම හිතට බයයි අම්මේ

(04). ජීවිතයට රැකවරණය තිසරණයයි අම්මේ
ඒ හින්දයි ගිහි ගෙදරින් පිට වූයේ අම්මේ
තිසරණ සරණින් මග එල ලැබ ගන්නයි අම්මේ
පමාවෙන්නෙ ඇයි හරි මග මුණ ගැසුනා අම්මේ

(05). සිත සතුටින් මා සසුනට පූජා කළ අම්මේ
මේ කාලේ ප්‍රජාපතී ගෝතමිය යි අම්මේ

පන්සිල් අටසිල් රකිමින් සිල්වත් වී අම්මේ
පමා නොවී මේ දහමෙන් එල නෙලන්න අම්මේ

(06). සතර අපායට වැටුනොත් යළිත් වරක් අම්මේ
තව කොපමණ මේ සසරේ යන්න වෙයිද අම්මේ
මේ සසරින් ගැලවෙන්නට හිතට ගනිමු අම්මේ
මා යන මඟ ඔබත් එන්න නිවන් දකිමු අම්මේ

(07). බුදු බණ පද හොඳින් අසා දරා ගන්න අම්මේ
නිරතුරුවම සිහි කරන්න ඒ බණ පද අම්මේ
දූ දරුවන් ගැන ආලය අතහරින්න අම්මේ
දහමින් තොර ජීවිතයක් දැන් මොකටද අම්මේ

(08). දිරමින් පොළවට පස් වන මේ කය ගැන අම්මේ
ආශාවක් නැතිව ඉන්න එය සතුටකි අම්මේ
ලැබෙනා දේකින් සතුටුව සිත රැකගෙන අම්මේ
ඉදිරියට ම පිය තබන්න නිවන් මගේ අම්මේ

(09). සිහි නුවණින් ගත කෙරුවොත් මුළු දවසම අම්මේ
අප ටික ටික ලං වෙනවා අම නිවනට අම්මේ
නුවණින් විමසා කය ගැන සිහිකෙරුවෙත් අම්මේ
දුක හදනා හේතුව ගැන තේරෙනවා අම්මේ

(10). මා සසුනට පූජ කළා පින හින්දා අම්මේ
මේ සසරින් ගැලවෙන්නට හැකි වෙනවා අම්මේ
මේ හැම දෙය ගැන ආලය අතහරින්න අම්මේ
දහමින් තොර ජීවිතයක් දැන් මොකටද අම්මේ




(01). වැටි වැටි ඇවිදින්න අත දුන් පියාණනී
වෙන් කොට හොඳ නරක පෙන්නූ පියාණනී
රැකවරණයට මා ළඟ සිටි පියාණනී
මගෙ ජීවිතේ සෙවණැල්ලයි පියාණනී

(02). දහඩිය මුගුරු හෙලමින් නුඹ පියාණනී
අපගේ දියුණුවයි පැතුවේ පියාණනී
රැස් කොට ධනය අපි වෙනුවෙන් පියාණනී
නුඹ නැහැ සැප වින්දෙ ආදර පියාණනී

(03). පාසල වෙතට මා ගෙන ගිය පියාණනී
රජ වෙනු දකින්නට පැතුව ද පියාණනී
සසරේ පුරුදු මතු වූ පසු පියාණනී
ගිහි ගෙය ගිනි ගෙයක් මට නම් පියාණනී

(04). සිදුහත් කුමරු ගිය දවසේ පියාණනී
සුද්ධෝදන නිරිඳු හැඬුවලු පියාණනී
සසර දුකින් ගැලවෙන්නට පියාණනී
සිදුහත් කුමරු ගිය මග යමි පියාණනී

(05). ගිහි ගෙය හැර දමා යන්නේ පියාණනී
ගුණ දම් දියුණු කර ගන්නයි පියාණනී
වරදක් ඇතොත් මා ගත් මග පියාණනී
පහදා දෙන්න නිවැරදි මග පියාණනී

(06). කොපමණ මිල මුදල් තිබුනත් පියාණනී
එහි නෑ සැපක් මට නම් දැන් පියාණනී
ටික ටික ළං වෙන්නෙ මරණෙට පියාණනී
රැකගෙන සනසන්නෙ කවුරුද පියාණනී

(07). මිනිසත් බවක් අපි ලැබුවේ පියාණනී
කප් සිය දහස් කල් ගෙවලයි පියාණනී
වැරදී ගියොත් මේ දිවියෙත් පියාණනී
යළි අපි වැටෙන්නේ දුකටයි පියාණනී

(08). පෙර පින් නිසා දැන් අපටත් පියාණනී
සම්බුදු සසුන මුණගැහුනා පියාණනී
මේ ලැබූ ක්ෂණය අත්නොහරිමු පියාණනී
වීරිය කරමු ගැලවෙන්නට පියාණනී

(09). රාගය හිතේ තියෙනා තුරු පියාණනී
දුක ම යි උරුම අපි කාටත් පියාණනී
ද්වේෂය දුරු කළොත් හිත තුළ පියාණනී
හැකිවේ ගැලවෙන්න සසරෙන් පියාණනී

(10). තිසරණ සරණ එහි මුල වේ පියාණනී
සිල්වත් වීම ඊළඟටයි පියාණනී
දුක හඳුනා ගන්න ලැබුනොත් පියාණනී
සම්බුදු සසුන කරගත්තා පියාණනී

(11). ගත සවි බලය දුරු වූ කල පියාණනී
සිත බැහැ වඩන්නට නිරතුරු පියාණනී
සවිබල පිරිහෙන්න කලියෙන් පියාණනී
කරගත්තොත් යමක් දිනුවා පියාණනී

(12). පෝදා පන්සලට යනවද පියාණනී
අට සිල් ගන්න මැලි වෙනවද පියාණනී
දැනගෙන අගය බුදු සසුනක පියාණනී
මේ ටික කළොත් ඔබ දිනුවා පියාණනී

(13). දැන් ඇති වෙහෙසුණා හොඳට ම පියාණනී
කොයි මොහොතක යන්න වේවි ද පියාණනී
තිසරණ සරණ ලැබ ආදර පියාණනී
සැනසෙන් අම නිවන ලැබගෙන පියාණනී



# අපි ගෞතම බුදු රජාණන් වහන්සේගේ සැබෑම ශ්‍රාවක දරුවන් වෙමු.

"පින්වත් මහණෙනි, සම්මා සම්බුද්ධ යනු
මේ ලෝකයේ පහළ වූ අතිශයින් ම ආශ්චර්යවත් මනුෂ්‍යයා යි.
පින්වත් මහණෙනි, සම්මා සම්බුද්ධත්වයට පත් වූ
උතුමෙකු පහළ වූවා යනු අඥානකම නමැති
අන්ධකාරය දුරු කරනා ප්‍රඥාලෝකයේ පහළ වීම යි.
මායා වංචා පිරි ගිය අසත්‍යයේ කඩතුරාව ඉරා දමනා
සත්‍යයේ උදාව යි.
දුක් දොම්නස් දුරු කරනා සෙත ශාන්තියේ උදාව යි.
සියලු මානසික වහල් බැමි වලින් මිදුණු
සනාතන විමුක්තියේ උදාව යි.
සැනසිලි මග හඳුනාගත් තථාගත ශ්‍රාවකයන් ගේ පහළවීම යි.
මෙසේ පින්වත් මහණෙනි, සම්මා සම්බුදු කෙනෙකු ගේ පහළ වීම
දෙව් මිනිසුන් ගේ භාග්‍යයේ උදාව යි

(ඒකපුද්ගල වර්ගය - අංගුත්තර නිකාය - 01)

"මහ පාර අයිනෙ කුණු දාන ලොකු වතුර වළවල් තියෙනවා. ඔය මඩ වතුරේ නෙළුමක් පිපෙනවා. ඒ නෙළුම් මල හරි ම සුවඳ යි. හරි ම ලස්සන යි.

මේ අන්ධ බාල පෘථග්ජනයන් ගේ ලෝකෙත් ඔය විදිහම යි. කුණු දාන වතුර වලක් වගේ. නමුත් ඔය ලෝකෙ ම යි සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ ශ්‍රාවකයා ප්‍රඥාවෙන් බබලන්නේ. මඩේ පිපිච්ච සුවඳ නෙළුමක් වගේ."

(ධම්ම පදය - පුප්ඵ වර්ගය)

## මහමෙව්නාව භාවනා අසපුව

e-mail : mahamevnawa@mahamevna.org | Web : www.mahamevna.org